# සටහන

2017 නොවැම්බර් - දෙසැම්බර් 11 - 12 කලාපය




2 කාම්බෝජයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 මුදල් විශුද්ධිකරණයේ ජාත්‍යන්තර පසුබිම හා ශ්‍රී ලංකාවේ ප්‍රවණතා

12 මූලික ව්‍යුත්පන්න උපකරණ හා අවදානම් කළමනාකරණය

18 ගෝලීය නවයතා දර්ශකය-2017


රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව







# කාම්බෝජය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...

| | |
|---|---|
| භූමි ප්‍රමාණය | |
| මුළු ප්‍රමාණය | වර්ග කි.මී. 181,035 |
| ගොඩ බිම් ප්‍රමාණය | වර්ග කි.මී. 175,515 |
| අභ්‍යන්තර ජලාශ | වර්ග කි.මී. 4,520 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 16,204,486 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 1.52% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | උපත් 23 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 7.5 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 64.9 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 47.4 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 0.3% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2008) | 37.9 |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 7,897 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 22.25 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 6.9% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 4,000 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය | |
| කෘෂිකර්මය | 25.3% |
| කර්මාන්ත | 32.8% |
| සේවා (2016 ඇස්තමේන්තු) | 41.9% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2017 ඇස්තමේන්තු) | -1.9% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 3.7% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 14.34 |
| ආනයන භාණ්ඩ | දැවි තෙල්, නිෂ්පාදන, සිගරට්, රත්‍රං, ඉදිකිරීම් වලට අදාළ අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ, බෙහෙත් ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 10.45 |
| අපනයන භාණ්ඩ | රෙදිපිළි, දැව, රබර්, සහල්, ඔක්සිජන්, දුම්කොළ, පාවහන් |

මූලාශ්‍රය: World Fact Book



# කාම්බෝජය

කම්පූචියාව යනුවෙන් ද හඳුන්වනු ලබන කාම්බෝජයේ නිල නාමය “කාම්බෝජ රාජධානිය” යනුයි. අග්නිදිග ආසියානු ඉන්දු-චීන අර්ධද්වීපයේ පිහිටි ස්වෛරී රාජ්‍යයක් වන මෙය වයඹ දෙසින් තායිලන්තයෙන් ද ඊසාන දෙසින් ලාඕසයෙන් ද නැගෙනහිරින් වියට්නාමයෙන් සහ නිරිත දෙසින් තායිලන්ත මුහුදින් වටවී තිබෙනවා. රටේ මුළු ජනගහනයෙන් 95%ක් ම ථෙරවාද බෞද්ධයන් වන අතර, වියට්නාම්, චීන සහ තවත් අග්නිදිග ආසියාතික සුළු ජන වර්ගයක් වන “චැම්“ ජාතිකයන්ගෙන් සහ 30ක් පමණ වන කඳුකර ගෝත්‍රිකයන්ගෙන් ඉතිරි සුළුතරය සමන්විත වෙනවා.

කාම්බෝජයේ දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික මධ්‍යස්ථානය ලෙසින් සැලකෙන “ඵනොම් පෙන්” අගනුවර ප්‍රංශය විසින් ඉන්දු චීන ප්‍රදේශයේ ගොඩනගන ලද මනස්කාන්ත නගරයක් ලෙස ප්‍රසිද්ධයි. වර්ෂ 1863 දී කාම්බෝජය ප්‍රංශ යටත් විජිතයක් බවට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස එය සිදුවුණා. 1953 දී නිදහස ලබා ගත් කාම්බෝජයේ දැන් පවතින්නේ ඡන්දයෙන් තෝරාපත් කරගන්නා රාජාණ්ඩු ක්‍රමයක්.

මූලාශ්‍රය: Wikipedia විශ්වකෝෂය

**මෙම කලාපයේ ලිපි සමාලෝචනය**
ඩී. කේ. විජේසූරිය මහතා, අතිරේක අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය
ආචාර්ය ටී. එම්. බී. ඒ. ගුණතිලක, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සන්නිවේදන දෙපාර්තමේන්තුව

“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් “සටහන” තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# මුදල් විශුද්ධිකරණයේ ජාත්‍යන්තර පසුබිම හා ශ්‍රී ලංකාවේ ප්‍රවණතා

**ඩබ්.ඩී.යූ.එස්.කේ. වීරසිංහ**
**සහකාර අධ්‍යක්ෂ, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව**

වර්තමානය වන විට සෑම රටක් ම පාහේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව සමස්ත ලෝක නිෂ්පාදිතයේ මූල්‍ය වටිනාකමින් 2% - 5% අතර ප්‍රමාණයක් මුදල් විශුද්ධිකරණයට ලක් වූ මුදල් වේ. මින් පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණය යනු ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ ගැටලුවක් බවයි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා සෑම රටක් ම පාහේ මේ සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීමට විවිධ පියවර ගෙන ඇත. මෙම කෙටි ලිපියේ අරමුණ වන්නේ ද මුදල් විශුද්ධිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාවලියට සාධනීය අයුරින් දායක වීමයි. මෙහි දී, මුදල් විශුද්ධිකරණය යනු කුමක් ද? මිනිසුන් මුදල් විශුද්ධිකරණයට යොමු වන්නේ ඇයි? මුදල් විශුද්ධිකරණයේ අහිතකර ප්‍රතිවිපාක, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමෙහි ලා ජාත්‍යන්තර දායකත්වය සහ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ ව විග්‍රහයක් කිරීමට අපේක්ෂිත ය.

## මුදල් විශුද්ධිකරණය යනු කුමක්ද?

මුදල් විශුද්ධිකරණය යන්නට පොදුවේ පිළිගත් නිර්වචනයක් සොයා ගැනීම ඉතා අපහසු ය. මුදල් විශුද්ධිකරණය සඳහා විවිධ පුද්ගලයන් හා විවිධ සංවිධාන නීති, විවිධ නිර්වචන ලබා දීමට උත්සාහ කර ඇත. එ වැනි එක් නිර්වචනයකට අනුව මුදල් විශුද්ධිකරණය යනු නීත්‍යනුකූල නො වන අයුරින් උපයා ගන්නා ලද ධනය සඳහා නීත්‍යනුකූල මුහුණුවරක් ලබාදීමේ ක්‍රියාවලියයි. *(Australian Transaction Report and Analysis Center, 2008)*

ඉහත නිර්වචනයට අනුව පැහැදිලි වන්නේ එය නීතිය හා බැඳුණු ක්‍රියාවලියක් වන බවත් නීත්‍යනුකූල නො වන ක්‍රමවේදයන් හරහා උපයන ලද වත්කම්වලට නීතිය ඉදිරියේ නීත්‍යනුකූල බවක් ලබාදීමට සිදු කරන්නක් බවත් ය.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ මූල්‍ය කාර්යය සාධක බලකායට (2016) අනුව නීත්‍යනුකූල නො වන අයුරින් උපයන ලද වත්කම්වල මූලය සැඟවීමේ ක්‍රියාවලිය මුදල් විශුද්ධිකරණය නම් වේ. මෙම අදහසට අනුව පැහැදිලි වන්නේ සමාජ සම්මත ක්‍රමවේදවලට පරිබාහිර ව උපයන ලද වත්කම්වල එකී ප්‍රභවය හෙවත් උත්පාදනය කරනු ලබන ක්‍රමය ව්‍යාජ ක්‍රම ඔස්සේ සඟවා තබන ක්‍රියාදාමය මුදල් විශුද්ධිකරණය ලෙස හඳුනා ගත හැකි බව යි.

මේ පිළිබඳ ව වන තවත් නිර්වචනයකට අනුව මුදල් විශුද්ධිකරණය යනු ”අපරාධකරුවන් සාපරාධී ක්‍රියා මගින් උපයාගත් මුදල්වල සැබෑ මූලයන් හා අයිතිය සැඟවීමට ගනු ලබන උත්සාහය හා ක්‍රියාවලියයි” (ඒකාබද්ධ මුදල් විශුද්ධිකරණ මෙහෙයුම් කණ්ඩායම) *(Ryder N, 2008)*.

මෙ වැනි සෑම නිර්වචනයකින් ම අවබෝධ වන ප්‍රධාන කාරණය වන්නේ මුදල් විශුද්ධිකරණය යන්න නීත්‍යනුකූල නො වන ක්‍රියාවලියක් මෙන් ම එය මූල්‍ය ක්‍රමය හා රටක ආර්ථිකය සමඟ ඍජු ව ම බද්ධ වූ ක්‍රියාවලියක් බව ය. එ නම් නීත්‍යනුකූල නො වන ක්‍රමවේද හරහා උපයන ලද වත්කම් නීත්‍යනුකූල ආර්ථික පරිසරයක් තුළ සංසරණය කිරීමට උත්සාහ කිරීමෙන් රටක මූල්‍ය පද්ධතියට අහිතකර බලපෑමක්

කිරීමට මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හේතු වන බවයි.

මේ පිළිබඳ ව ආර්ථික විද්‍යාත්මක පදනමක සිට මැසිනඩරෝ නම් චින්තකයා අදහස් ඉදිරිපත් කර ඇත. ඔහුට අනුව ද්‍රවශීලතා ප්‍රභවයේ පරිවර්තනයක් සිදු කිරීමට භව්‍ය ක්‍රය ශක්තිය සත්‍ය ක්‍රය ශක්තියක් බවට පරිවර්තනය කිරීමෙන් පරිභෝජනය, ඉතුරුම්, ආයෝජන හා ප්‍රති ආයෝජන සිදු කිරීම සඳහා කරනු ලබන ස්වාධීන නීති විරෝධී ආර්ථික කටයුත්ත මුදල් විශුද්ධිකරණය ලෙස හඳුන්වයි. *(Masciandaro. 2007)*

ඉහත විවිධ නිර්වචනයන් සලකා බලන විට මුදල් විශුද්ධිකරණය යනු ඉතා ම සංකීර්ණ මෙන් ම නීතියේ රැහැනට අසුකර ගැනීමට අපහසු, මූල්‍ය හා ආර්ථික ක්‍රමය අස්ථාවර කිරීමට බලපාන්නක් බව පැහැදිලි වේ. මෙම සියලු අදහස් සම්පිණ්ඩනය කළ විට මුදල් විශුද්ධිකරණය පහත ලක්ෂණවලින් සමන්විත වන බව දැකිය හැකි ය.

1. **මුදල් විශුද්ධිකරණය යනු ක්‍රියාවලියකි.**

   එ නම් මුදල් විශුද්ධිකරණය යනු නීත්‍යානුකූල නො වන අයුරින් උපයා ගන්නා ලද ධනය නීතිමය රාමුව තුළ ස්ථාපනය කිරීම, ඇතිරීම, ඒකාබද්ධ කිරීම ආදී පියවර රැසක් යටතේ සිදු වන ක්‍රියාවලියක් වේ.

2. **මුදල් විශුද්ධිකරණය දැනුම පදනම් කරගත් ක්‍රියාවලියකි.**

   මුදල් විශුද්ධිකරණය සිදු කිරීමට, නීතිය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය ආදී විවිධ ක්ෂේත්‍රයන්ගේ දැනුම භාවිත කරනු ලබයි. නීතිය පිළිබඳ දැනුම නීතිමය රාමුවෙන් රිංගා යාමට ද, බැංකුකරණය මූල්‍ය පද්ධතිය තුළ එකී වත්කම් ස්ථාපනය කිරීමට ද තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ගනුදෙනු සංකීර්ණ කිරීමට ද යොදා ගනු ලබයි.

3. **මුදල් විශුද්ධිකරණය යනු දේශ සීමාවන් ඉක්මවා ගිය ක්‍රියාවලියකි.**

   මුදල් විශුද්ධිකරණය සිදු කරනු ලබන පුද්ගලයන් විසින් එක් රටකින් උපයනු ලබන මුදල් වෙනත් රටවල් ගණනාවක දී භාවිතයට ගනු ලබයි. විවිධ ක්‍රම හරහා ජාතික රාජ්‍යයන්ගේ සීමාවෙන් ඔබ්බට ගොස් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය ජාත්‍යන්තරීකරණය වී ඇත.

උදාහරණයක් ලෙස විවිධ ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් ලෝකයේ නොයෙක් ප්‍රදේශවල දී උපයනු ලබන මුදල් එ වැනි සංවිධානවල මූලස්ථානය කරා ගෙන එනු ලබයි. මේ අනුව පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණය යනු විශාල වශයෙන් ව්‍යාප්ත වූ ක්‍රියාවලියක් බවයි.

මෙම ලක්ෂණයන්ට අනුව මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය සෑම සමාජයක් ම පාහේ අවධානයට යොමු කළ යුතු කාරණයක් බව පැහැදිලි වේ. ඕනෑම සමාජයක එහි සුරක්ෂිතතාව ස්ථාපිත කරනු වස් මනාව ස්ථාවර වූ මූල්‍ය පද්ධතියක් මෙන් ම ආර්ථික රටාවක් පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය වේ. එකී සමාජ අවශ්‍යතාවට අභියෝග කර අහිතකර ප්‍රතිඵල රැසක් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හරහා සිදු වේ. ඒ අනුව මුදල් විශුද්ධිකරණය හේතුවෙන් යම් රටක් හෝ ආර්ථික ක්‍රමයක් තුළ ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල පිළිබඳ ව සාකච්ඡා කිරීම වඩාත් කාලෝචිත ය. මෙහිලා මුදල් විශුද්ධිකරණය වැළැක්විය යුත්තේ මන්ද යන ගැටලුවට පිළිතුරු සපයා ගැනීමට ද එහි ඇති අහිතකර බලපෑම හඳුනා ගැනීම අතිශය වැදගත් කාරණයකි.

### මුදල් විශුද්ධිකරණය වැළැක්විය යුත්තේ ඇයි?

විවිධ හේතු පදනම් කොට ගෙන විවිධ පුද්ගලයන් හෝ කණ්ඩායම් විසින් මුදල් විශුද්ධිකරණය සිදු කරයි. නීත්‍යානුකූල නො වන අයුරින් උපයන ලද වත්කම්වල මූලය සැඟවීම, නඩු කටයුතුවලින් හා නීතියෙන් රිංගා යාම, බදු ගෙවීම පැහැර හැරීම ආදිය එකී හේතු අතර සමහරකි. මෙකී කුමන හේතුවකින් හෝ මුදල් විශුද්ධිකරණයේ නිරත වීම ආර්ථිකය හා මූල්‍ය පද්ධතිය කෙරෙහි විවිධාකාරයෙන් අහිතකර ව බලපායි. මේ අතරින් එක් ප්‍රධාන කාරණයක් වන්නේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හරහා රටක මූල්‍ය පද්ධතිය අස්ථාවර විය හැකි වීමයි. එකවර විශාල මුදල් ප්‍රමාණයක් ගලා ඒම, හදිසියේ එම මුදල් මූල්‍ය පද්ධතියෙන් ඉවතට ගලා යාම වැනි ක්‍රියා පදනම් කොට ගෙන මූල්‍ය පද්ධතිය අසමතුලිත විය හැකි ය. උදාහරණයක් ලෙස කිසියම් පුද්ගලයෙක් මුදල් විශුද්ධිකරණය කර එකවරම බැංකුවක තැන්පත් කළ හැකි අතර කිසියම් අවස්ථාවක දී ඔහු විසින් එම මුදල් එකවර ම ආපසු ගැනීම පෙන්වා දිය හැකි ය. මෙ වැනි අවස්ථාවක තාවකාලික ව ලැබුණු මුදල්වලින් බැංකුව විවිධ ආයෝජනවලට පෙළඹුණහොත් මුදල් විශුද්ධිකරණය කරන ලද පුද්ගලයා මුදල් ආපසු ඉල්ලා සිටි මොහොතේ ම නැවත ලබා දීම අපහසු විය හැකි ය.

මෙවැනි කටයුත්තක් දීර්ඝ ව ව්‍යාප්ත වුවහොත් අදාළ බැංකුව බංකොලොත් වීමේ අවදානමක් ඇති විය හැකි අතර එය සමස්ත මූල්‍ය පද්ධතියට ම කම්පන ඇති වන ආකාරයෙන් පැතිර යාමේ අවදානමක් ද ඇත. මේ අනුව පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය මූල්‍ය පද්ධති ස්ථායිතාවට අහිතකර අන්දමින් ක්‍රියාත්මක විය හැකි බවයි.

සාර්ව ආර්ථික පරිසරය තුළ නොසිතුවිරූ අන්දමේ විචලනයන් ඇති වීමට ද මුදල් විශුද්ධිකරණය හේතු වේ. උදාහරණයක් ලෙස වෙනත් රටක කිසියම් පුද්ගලයෙකු නීත්‍යනුකූල නො වන අයුරින් උපයන ලද විදේශ මුදල් ශ්‍රී ලංකාවේ බැංකුවක් තුළ තැන්පත් කිරීම සලකා බලමු. එ වැනි අවස්ථාවක දී එකී බැංකුව හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ගලා එන විදේශ මුදල් විනිමය අනුපාතය කෙරෙහි විවිධ ස්වරූපයේ බලපෑම් සිදු කළ හැකි ය. මෙම මුදල් තැන්පතුව මෙරට විදේශ විනිමය වෙළෙඳපොළෙන් ඉවත්ව යාම හෝ විනිමය වෙළෙඳපොළ තුළ රඳා පැවතීම පිළිබඳ ස්ථාවර බවක් නැත. මේ නිසා විනිමය අනුපාතය විචලනයට ලක්වීමට මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය විවිධාකාරයෙන් බලපෑම් කළ හැකි බව පැහැදිලි වේ. එ මගින් රටේ ආනයන අපනයන කටයුතුවලට ද උක්ත සිදු වීම සෘජු හෝ වක්‍ර ව බලපෑ හැකි ය. ඉහත උදාහරණයෙන් පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණය රටක සාර්ව ආර්ථික ක්‍රියාවලියේ ස්ථායිතාවට අහිතකර අයුරින් බලපාන බවයි.

මුදල් විශුද්ධිකරණයේ තවත් අහිතකර ප්‍රතිවිපාකයක් වන්නේ රජයේ බදු ආදායම අහිමි වී යාමයි. විවිධ නීත්‍යනුකූල නො වන ක්‍රියාමාර්ග මගින් උපයන ලද මුදල් කූට උපක්‍රම ඔස්සේ රජයේ බදු සම්බන්ධ නීතිවලින් මුවා වී විවිධ ආර්ථික කටයුතුවලට යොදා ගැනීමට මුදල් විශුද්ධිකරණය කරන පුද්ගලයන් උත්සාහ කරයි. විශේෂයෙන් ම අසාමාන්‍ය ධනයක් උපයා ඇති විටෙක නීත්‍යනුකූල පරිසරයක් තුළ දී රජයට බදු ගෙවීමට සිදු වේ. එ වැනි බදු ගෙවීමේ ක්‍රියාවලියක් තුළ දී ඔවුන් ධනය උපයා ගත් අයුරු පිළිබඳ ව තොරතුරු රජයට ලබා ගත හැකි ය. මේ හේතුවෙන් නීත්‍යනුකූල නො වන අයුරින් උපයන ලද ධනය විවිධ කාර්යයන්වලට යොදා ගැනීමේ දී ඒවායේ මූලය සැඟවීමට සිදු වන අතර එ මගින් රජයේ බදු ආදායම අහිමි වීමක් ද සිදු වේ. නීත්‍යනුකූල නො වන මාර්ග ඔස්සේ උපයන ලද මුදල් විශුද්ධිකරණය කිරීම තුළින් රජයේ බදු අහිමිවීම ද උක්ත ක්‍රියාවලියේ තවත් අහිතකර ප්‍රතිඵලයක් බව ඉහත කරුණුවලින් සනාථ වේ.

මේ හැරුණු විට අපරාධ දිරිමත් කිරීම, මූල්‍ය හා ආර්ථික ක්‍රමය පාලනය කිරීම අපහසු වීම, රටක මූල්‍ය විනය හා නීතිය සම්බන්ධයෙන් වන විශ්වාසය බිඳ වැටීම ආදී විවිධාකාරයේ අහිතකර ප්‍රතිඵල රැසකට මුදල් විශුද්ධිකරණය හේතු වේ. මුදල් විශුද්ධිකරණය වැළැක්විය යුත්තේ මන්ද යන ගැටලුවට පිළිතුර වන්නේ මුදල් විශුද්ධිකරණය හරහා ආර්ථිකයක සිදු විය හැකි ඉහත ආකාරයේ ගැටලුකාරී තත්ත්වයන් වළක්වා ගැනීමට ඇති අවශ්‍යතාවයි. වෙනත් අයුරකින් පවසන්නේ නම් මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හේතු කොට ගෙන කිසියම් රටක් හෝ සමාජයක් තුළ ඉහතින් විග්‍රහ කරන ආකාරයේ අහිතකර ප්‍රතිඵල රැසක් ඇති විය හැකි බවත්, එකී අහිතකර තත්ත්වයන්ගෙන් සමාජය හෝ ආර්ථිකය සුරක්ෂිත කර ගැනීමට ඉහත අහිතකර ප්‍රතිඵල රැසකට ම හේතු වන මුදල් විශුද්ධිකරණය වැළැක්විය යුතු බවත් ය. මෙම සියලු කරුණුවලින් තහවුරු වන්නේ ඉහත විවිධ හේතු හා ප්‍රතිඵල නිසාවෙන් මුදල් විශුද්ධිකරණය යනු සමාජයෙන් වැළැක්විය යුත්තක් බවය. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට නම් එම ක්‍රියාවලිය සිදු වන ආකාරය පිළිබඳ ව මනා වැටහීමක් තිබිය යුතු ය.

### මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය

මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය පියවර කිහිපයකින් යුක්ත වේ. විද්වතුන්ගේ විශ්ලේෂණයට අනුව එය පහත ක්‍රියාමාර්ගයන් ත්‍රිත්වය ඔස්සේ විග්‍රහ කළ හැකි ය. එ නම්,

1. ස්ථාපනය
2. ඇතිරීම
3. ඒකාබද්ධ කිරීම වේ.

#### 1. ස්ථාපනය

මුදල් විශුද්ධිකරණයේ ප්‍රථම පියවර වන්නේ ස්ථාපනයයි. නීත්‍යනුකූල නො වන අයුරින් උපයන ලද ධනය නීත්‍යනුකූල මූල්‍ය පද්ධතිය තුළ ස්ථාපිත කිරීම නැති නම් ඊට ඇතුළු කිරීම මින් අදහස් වේ. එය විවිධ ක්‍රම ඔස්සේ සිදු වනු දැක ගත හැකි ය. මෙසේ උත්පාදනය කරන ලද ධනය කුඩා කොටස්වලට බෙදා බැංකුවල, මූල්‍ය සමාගම්වල, රක්ෂණ සමාගම්වල හෝ කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීම මෙ මගින් සිදු වේ. නීත්‍යනුකූල නො වන වත්කම් නීතිමය රාමුවක් සහිත මූල්‍ය පද්ධතියට ඇතුළ් කිරීමේ මූලික පියවර ස්ථාපනය බව මේ අනුව පැහැදිලි වේ.

**2. ඇතිරීම**

මුදල් විශුද්ධිකරණයේ දෙවන පියවර වන ඇතිරීම නම් අදියරේ දී සිදු වන්නේ මූලික ව මූල්‍ය පද්ධතියට ඇතුළත් කරන ලද ධනය විවිධ ගනුදෙනු හුවමාරු ක්‍රම හරහා මූලාරම්භයෙන් විවිධ සංකීර්ණ දිශානතීන්ට යොමු කිරීමයි. පහත උදාහරණය සලකා බලමු. කිසියම් පුද්ගලයෙක් නීත්‍යානුකූල නො වන අයුරින් උපයන ලද මුදලක් විවිධ ස්වරූපයේ තැන්පතු ක්‍රම හරහා මූල්‍ය ආයතනගත කර ඇත. ඉන් පසු ඔහු සිදු කරන්නේ ඒවා එම තැන්පතුවලින් නැවත ලබාගෙන විවිධ වත්කම් මිල දී ගැනීම, ඒවා නැවත විකිණීම, නැවත වෙනත් ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම, රක්ෂණ වරණ ලබා ගැනීම ආදී වූ සංකීර්ණ ගනුදෙනු ජාලයකට යොමු කිරීමයි. මෙහි මූලික අරමුණ වන්නේ නෛතික රාමුවට එකවර හසු නො වන අයුරින් උක්ත මුදල් ඉතා සංකීර්ණ වපසරියක් තුළ ව්‍යාප්ත කිරීමයි. එ වැනි අවස්ථාවක ඒවා විශුද්ධිකරණය කරන ලද මුදල් ද යන්න සොයා ගැනීම ඉතා අපහසු ය. මේ අනුව පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණයේ දෙවන පියවර වන ඇතිරීමේ දී සිදු වන්නේ නීත්‍යානුකූල නො වන වත්කම් මූල්‍ය සෙවීමට අපහසු වන ආකාරයෙන් නීත්‍යානුකූල මූල්‍ය පද්ධතිය තුළ විසරණය කිරීම යන්නයි.

**3. ඒකාබද්ධ කිරීම**

දෙවැනි පියවරේ දී නීත්‍යානුකූල මූල්‍ය පද්ධතිය තුළ අතුරන ලද මුදල් නීත්‍යානුකූල වත්කම්වලට ඒකාබද්ධ කිරීම මෙම අදියරේ දී සිදු වේ. විද්වත් මතයට අනුව මුදල් විශුද්ධිකරණයේ අවසන් පියවර වන්නේ මෙයයි. ප්‍රතිආයෝජනය, විවිධ ව්‍යාපාර, සුඛසාධන ව්‍යාපෘති ආදී විවිධ ස්වරූපයන්ගෙන් මෙය සිදු වේ. මෙම අවස්ථාව වන විට විවිධ රටවල් විවිධ මුදල් ඒකකවලින් උත්පාදනය කරන ලද නීත්‍යානුකූල නො වන වත්කම් වෙනත් රටවල මුදල් ඒකකවලට මාරු වීම ද සිදු විය හැකි ය. එම නිසා විශුද්ධිකරණය කරන ලද මුදල් නීත්‍යානුකූල රාමුවට ඒකාබද්ධ කිරීමෙන් පසු ඒවායේ පසුබිම සොයා යාම ඉතා අසීරු ය.

ඉහත පියවර සියල්ල සලකා බලන විට පැහැදිලි වන්නේ මුදල් විශුද්ධිකරණය යනු ඉතා සංකීර්ණ මෙන් ම විශාල පරාසයක් ඔස්සේ ව්‍යාප්ත වූ ක්‍රියාවලියක් බවයි. මුදල් විශුද්ධිකරණය පිළිබඳ තොරතුරු රැස් කිරීමට, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට නව නීති සකස් කිරීම ආදී කටයුතු සඳහා මුදල් විශුද්ධිකරණයේ උක්ත පියවරයන් පිළිබඳ ව මනා අවබෝධයක් තිබිය යුතු ය. ඉහතින් ඉදිරිපත් කරන ලද්දේ මුදල් විශුද්ධිකරණයේ විවිධ අදියර පිළිබඳ සරල විග්‍රහයකි. ලෝකයේ විවිධ රටවල් මෙම ක්‍රියාවලියේ ඇති සංකීර්ණභාවය සහ එයින් සමාජයට ඇති වන අහිතකර ප්‍රතිඵල පිළිබඳ ව ඇති අවබෝධය පදනම් කොට ගෙන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ලිපියෙහි මීළඟට සිදු කරනු ලබන්නේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියේ ජාත්‍යන්තර සන්දර්භය පිළිබඳ ව විවිධ ආයතන හා රටවල් ඇසුරෙන් ලොව පුරා ගොඩ නැගී ඇති සංවාදය පිළිබඳ ව අවධානය යොමු කිරීමයි.

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ජාත්‍යන්තර පසුබිම**

බොහෝ සාහිත්‍ය මූලාශ්‍රයන්ට අනුව ජාත්‍යන්තර සන්දර්භය තුළ මුදල් විශුද්ධිකරණය යන පදය මුලින් ම හමුවන්නේ ඇමරිකා එක්සත් ජනපදයෙනි. ඒ 1920 දී පමණ නිව්යෝක් නගරය මුල් කරගෙන පැවැති මුදල් ව්‍යාපාරයක නීත්‍යානුකූල නො වන හැසිරීමට අදාළ ව ය. එහෙත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට ජාත්‍යන්තර අවධානය යොමු වන්නේ ඊට බොහෝ කලකට පසු ව ය. මෙහිලා වර්තමානය වන විට විවිධ රටවල් විවිධ පියවර ගෙන ඇත. විවිධ රටවල් විවිධ අණපනත් සම්මත කිරීම, ජාත්‍යන්තර වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම අරමුණු කොට ගෙන විවිධ සංවිධාන බිහිවීම ඒවා අතරින් ප්‍රධාන වේ. 1986 දී ඇමරිකා එක්සත් ජනපදය විසින් සම්මත කරනු ලැබූ "මුදල් විශුද්ධිකරණය පාලන පනත" එවකට රටක් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට තැබූ ප්‍රථම පියවර ලෙස බොහෝ විද්වතුන් පෙන්වා දී ඇත. අනතුරුව මහා බ්‍රිතාන්‍යය ද 1986 දී ම "මත්ද්‍රව්‍ය ජාවාරම් වැරදි පිළිබඳ පනත" යටතේ උක්ත ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙන යන ලදි. මෙම ආරම්භයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල් මේ වන විට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව විවිධ අණපනත් සම්මත කොටගෙන ඇත. ඒවා එකිනෙක වෙන වෙනම පැහැදිලි කිරීම අසීරු මෙන් ම සංකීර්ණ කාර්යයක් වන හෙයින් මෙම ලිපියෙහි ජාත්‍යන්තරමය වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට බිහිකර ගන්නා ලද සංවිධාන ත්‍රිත්වයක් පිළිබඳ ව පාඨක අවධානය යොමු කිරීම මින් ඔබ්බට සිදුවේ.

**එග්මන්ට් සමූහය**

බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර එග්මන්ට් ඇරින්බර්ග් මාලිගයට රැස් වූ විවිධ රටවල මූල්‍ය බුද්ධි ඒකකයන්හි නියෝජිතයන් කිහිප දෙනෙක් එක් ව ජාත්‍යන්තර වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා

සහයෝගීතාවෙන් යුක්ත ව කටයුතු කිරීමට බිහි කර ගන්නා ලද අවිධිමත් සංවිධානය එග්මන්ට් සමූහය *(Egmont Group)* නම් වේ. මෙහි සාමාජිකත්වය දරන්නේ විවිධ රටවල මූල්‍ය බුද්ධි ඒකකයන් ය. මෙම සංවිධානයේ මූලික අරමුණ වන්නේ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කණ්ඩායම්වල මූල්‍ය කටයුතු ජාත්‍යන්තර වශයෙන් වැළැක්වීමට පහසුකම් සැපයීමයි. එග්මන්ට් සමූහය මෙම අරමුණට අදාළ ව ජාත්‍යන්තර වශයෙන් ගොඩ නගන ලද සංවාදය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමෙහිලා අන්තර්ජාතික ව තැබූ යෝධ පියවරක් ලෙස හඳුනා ගත හැකි ය. 2015 වර්ෂය වන විට එග්මන්ට් සමූහයේ සාමාජිකත්වය රටවල් 151ක් පමණ වේ. එග්මන්ට් සමූහයේ අරමුණ වන එ නම් ජාත්‍යන්තර වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව පහසුකම් සැපයීම සාක්ෂාත් කර ගැනීමට ඔවුන් මේ වන විට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව එග්මන්ට් සමූහයේ කාර්යයභාරය පහත පරිදි පෙළ ගැස්විය හැකි ය.

1. අන්‍යෝන්‍ය තොරතුරු හුවමාරු කිරීමේ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රසාරණය හා ක්‍රමානුකූල බවට පත් කිරීම
2. මූල්‍ය බුද්ධි ඒකකයන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, විශේෂඥ දැනුම වැඩිදියුණු කිරීම හා පුහුණුව ලත් විවිධ නිලධාරීන් විවිධ රටවල් සමඟ හුවමාරු කර ගැනීම ප්‍රචලිත කිරීමට පහසුකම් සැපයීම
3. එග්මන්ට් ආරක්ෂිත ජාලය *(Egmont Secure Web ESW)* වැනි තාක්ෂණික භාවිතයන් හරහා මූල්‍ය බුද්ධි ඒකකයන් අතර වඩා සාධනීය හා ආරක්ෂිත සන්නිවේදන පහසුකම් සංවර්ධනය සඳහා දායක වීම
4. සාමාජික මූල්‍ය බුද්ධි ඒකකයන්හි ස්වාධීන ව පවත්වා ගෙන යන මෙහෙයුම් කටයුතු ඉහළ නැංවීම සඳහා සහාය දීම
5. මූල්‍ය බුද්ධි ඒකකයන්හි මෙහෙයුම් අංශ අතර සහයෝගය හා සම්බන්ධීකරණය ඉහළ නැංවීමට කටයුතු කිරීම
6. මූල්‍ය බුද්ධි ඒකක නීතිමය සහයෝගය සහිත ව පිහිටුවීම සඳහා සහයෝගය දීම හා සංවර්ධනය වීමේ ආරම්භක පියවරේ සිටින මූල්‍ය බුද්ධි ඒකක සඳහා සහයෝගය ලබාදීම

එග්මන්ට් සමූහය විසින් විවිධ රටවල මූල්‍ය බුද්ධි ඒකක අතර තොරතුරු සන්නිවේදනය, දැනුම ප්‍රවර්ධනය වැනි ක්ෂේත්‍ර ඔස්සේ මූල්‍ය විශුද්ධිකරණයට එරෙහි ව ජාත්‍යන්තර ව හඬ අවදි කිරීම සඳහා විශාල සේවයක් ඉටු කරන බව එහි ඉහත කාර්යයන් එකිනෙක විමර්ශනය කිරීමෙන් ඉතා පහසුවෙන් අවබෝධ කර ගත හැකි ය. එග්මන්ට් සමූහය හැරුණු විට තවත් විවිධ ජාත්‍යන්තර සංවිධාන මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට දායක වී ඇත. *(http://www.egmontgroup.org)*

### මූල්‍ය කාර්ය සාධක බලකාය

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා පිහිටුවා ගත් තවත් ජාත්‍යන්තර සංවිධානයක් ලෙස මෙය හඳුන්වා දිය හැකි ය. 1989 දී ප්‍රංශයේ පැරිස් නුවරට රැස් වූ *G7* කණ්ඩායමේ සාමාජිකයන් මූල්‍ය ක්‍රියාකාරී කාර්යය බලකාය නම් සංවිධානය බිහිකර ගන්නා ලදි. මුල් කාලයේ දී මෙහි ප්‍රධාන අරමුණ වූයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ජාත්‍යන්තර කටයුතු සිදු කර ගෙන යාමයි. කල් යත් ම ලෝක ත්‍රස්තවාදී මූල්‍ය ජාලවල ව්‍යාප්තිය හේතු කොට ගෙන එය වැළැක්වීමට අදාළ මෙහෙයුම් සිදු කිරීම ද ඉහත ප්‍රධාන අරමුණට බද්ධ කරන ලදි. මේ වන විට මෙම සංවිධානය උක්ත කාර්යයන් ද්විත්වය ම සපුරා ගැනීම සඳහා විවිධාකාරයේ සම්මුතීන්, ව්‍යවස්ථාමය කරුණු සකස් කොට ඉදිරිපත් කිරීම ඉතා මැනවින් සිදු කරන බව දැක ගත හැකි ය. 1990 දී ඉදිරිපත් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, අදාළ මෙම සංවිධානයේ නිර්දේශ 1996, 2001, 2003, 2012 වර්ෂයන්හි දී නව ජාත්‍යන්තර තත්ත්වයන්ට ගැලපෙන ප්‍රමිතීන් සේ යාවත්කාලීන කොට ඉදිරිපත් කර ඇත. මෙම ආයතනය විසින් සම්පාදනය කරන ලද ඉහත නිර්දේශයන්ගේ මූලික අරමුණ වන්නේ මූල්‍ය පද්ධතියේ ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම හා එහි යහපත් ක්‍රියාකාරිත්වය සහතික කිරීමයි. මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ කාර්යය බලකාය සම්බන්ධයෙන් කරන ලද ඉහත පැහැදිලි කිරීමට අනුව අවබෝධ වන්නේ මෙම සංවිධානය මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදී කණ්ඩායම්වල මූල්‍ය කටයුතු මැඩ පැවැත්වීමෙහිලා අන්තර් ජාතික වශයෙන් විශාල කාර්යය භාරයක් ඉටුකරමින් සිටින බවයි.

### මුදල් විශුද්ධිකරණය පිළිබඳ ව ආසියා පැසිපික් සමූහය

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ව ආසියා පැසිපික් සමූහය යනු ආසියා පැසිපික් කලාපය තුළ මූල්‍ය කාර්යය සාධක බලකායේ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාම

සඳහා පිහිටුවා ගන්නා ලද කලාපීය සංවිධානයකි. මූල්‍ය කාර්යය සාධක බලකාය පොදුරාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය සමඟ එක් ව ආසියානු කලාපය තුළ මූල්‍ය විශුද්ධිකරණය පිළිබඳ ව දැනුම්වත් කිරීම 90 දශකයේ මුල භාගයේ සිට ආරම්භ කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස 1997 තායිලන්තයේ බැංකොක් නුවර දී සාමාජික රටවල් 13ක ප්‍රධානත්වයෙන් මෙම සංවිධානය පිහිටුවන ලදී. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිපික් සමූහයට අදාළ ලේකම් කාර්යාලයක් ද මේ සමඟ ම ආරම්භ කරන ලදී. එය ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ස්ථාපිත කර ඇති අතර සාමාජික රටවල් ඒවායේ දළ දේශීය නිෂ්පාදිතයට අදාළ සූත්‍රයක් පදනම් කොට ගෙන මෙම ආයතනය පවත්වා ගෙන යාම සඳහා මුදල් සපයයි. මෙම කලාපීය සංවිධානයේ මූලික කාර්යය භාරය වන්නේ කලාපය තුළ මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමට හා ත්‍රස්තවාදී මූල්‍ය කටයුතු වැළැක්වීමට අදාළ ගෝලීය ප්‍රමිතීන් කලාපය තුළ ක්‍රියාත්මක කිරීමයි. මේ හැරුණු විට, මෙම ආයතනය විසින් පහත මූලික ක්‍රියාකාරකම් 5 කර ගෙන යනු ලබයි.

1. කලාපීය සාමාජික රටවල් විසින් මූල්‍ය විශුද්ධිකරණය පිළිබඳ ව අන්‍යෝන්‍ය ඇගයීම් කටයුතු කරගෙන යාම සඳහා පහසුකම් සැපයීම

   මේ යටතේ ගෝලීය වශයෙන් පවතින මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ප්‍රමිතීන් එක් එක් රටවල් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ ව ඔවුනොවුන් ම අන්‍යෝන්‍ය වශයෙන් කලාපය තුළදී ඇගයීම් කටයුතු පවත්වා ගෙන යාම සිදු කෙරේ

2. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිපික් සමූහය විසින් සාමාජික රටවල්වලට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව තාක්ෂණික දැනුම ලබාදීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම
3. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ව විශ්ලේෂණාත්මක පරීක්ෂණ පැවැත්වීම දිරිමත් කිරීම
4. ගෝලීය වශයෙන් සම්පාදනය කරනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදී මූල්‍ය කටයුතු වැළැක්වීමෙන් ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට ආසියා පැසිපික් කලාපය පොදුවේ නියෝජනය කිරීම
5. පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම

   ආසියා පැසිපික් කලාපය තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා මූල්‍ය හා මූල්‍ය නො වන ආයතන, රාජ්‍ය නො වන සංවිධාන, විවිධ අධ්‍යාපනික කණ්ඩායම් සම්බන්ධ කර ගැනීම ද මෙම ආයතනය විසින් සිදු කරයි. *(www.apgml.org)*

ඉහතින් දැක්වූයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ ව ආසියානු පැසිපික් සමූහයේ ආරම්භය සහ එහි කාර්යයභාරය පිළිබඳ ව කෙටි විග්‍රහයකි. ඉහත තොරතුරු අනුව පෙනී යන්නේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව කලාපීය මෙහෙයුම් සහ ජාත්‍යන්තර මෙහෙයුම් මෙම සංවිධානය විසින් සිදු කෙරෙන බවයි.

මුදල් විශුද්ධිකරණය ජාත්‍යන්තර මට්ටමෙන් වැළැක්වීමෙහිලා ඉහත සංවිධාන ත්‍රිත්වයේ ම කාර්යභාරය අතිවිශාල ය. මෙම සංවිධාන ත්‍රිත්වය මෙන් ම තවත් විවිධාකාර ජාත්‍යන්තර සංවිධාන හා ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ලොව බොහෝ රටවල් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට පහත ආකාරයේ පියවරක් ගෙන ඇත.

1. නීති විරෝධී මත්ද්‍රව්‍යවලට අදාළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම
2. ඒ හැරුණු විට වෙනත් අපරාධ ආශ්‍රිත ව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම
3. ගනුදෙනුකරු මුදල් ලබාගත් ආකාරය පිළිබඳ දැනුම්වත්වීම *(Know your Customer - K.Y.C.)*
4. විශාල ගනුදෙනු පිළිබඳ වාර්තා ලබා ගැනීම.
5. සැක සහිත ගනුදෙනු පිළිබඳ ව අදාළ ආයතනය වෙත වාර්තා කිරීම
6. වාර්තා දිගින් දිගට ම පවත්වා ගෙන යාම.
7. නීති විරෝධී සැක සහිත ගනුදෙනු පිළිබඳ ව අදාළ පුද්ගලයා දැනුවත් කිරීම
8. දේශ සීමා හරහා මුදල් හුවමාරු කිරීමේ දී සිදු විය හැකි මූල්‍ය අපරාධවලට එරෙහි ව පියවර ගැනීම
9. මූල්‍ය බුද්ධි ඒකක පිහිටුවීම.
10. ජාත්‍යන්තර නීතීන් ක්‍රියාත්මක කිරීමට අදාළ දේශීය සහයෝගය ලබා දීම
11. වත්කම් ඉපයීම පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට යාන්ත්‍රණයක් සකස් කිරීම

12. එක්සත් ජාතීන්ගේ ත්‍රස්ත මූල්‍ය මර්දන ප්‍රඥප්තියේ සාමාජික රාජ්‍යයක් වීම ඇතුළු මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ විවිධ ජාත්‍යන්තර සම්මුතීන්ට අත්සන් තැබීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

ඉහතින් දක්වන ලද්දේ විවිධ රටවල් විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග අතරින් කිහිපයක් පමණි. ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරිත්වය, මූල්‍ය අපරාධ හේතුවෙන් ගෝලීය මූල්‍ය පද්ධතියට සිදු වන අවදානම වැඩිවීම, ඒ ආශ්‍රිත දැනුම ප්‍රවර්ධනය වැනි කාරණා විවිධ රටවල් විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා විවිධ පියවරයන් ගැනීමට පාදක වන්නට ඇතැ යි සිතිය හැකි ය.

එම ජාත්‍යන්තර ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව ද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ දේශීය යාන්ත්‍රණය සකස් කර ඇත. මෙම ලිපියේ මීළඟ කොටස වෙන්වී ඇත්තේ එ කී දේශීය යාන්ත්‍රණය පිළිබඳ ව කෙරෙන විචාරාත්මක විග්‍රහයකට ය.

### ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය පිළිබඳ කතිකාව සහ එහි ප්‍රවණතා

මෙරට පැවති බෙදුම්වාදී සන්නද්ධ අරගලයේ එක් පාර්ශ්වයක් වූ එල්.ටී.ටී.ඊ. සංවිධානය සැලකිය යුතු අන්දමේ මූල්‍ය සම්පත් ප්‍රමාණයක් අත්පත් කර ගෙන තිබූ ත්‍රස්තවාදී කණ්ඩායමක් බව නො රහසකි. මෙම සංවිධානය නීත්‍යානුකූල නො වන ක්‍රමවේද ඔස්සේ මූල්‍ය ත්‍රස්තවාදය පවත්වාගෙන ගියේ ය. එල්.ටී.ටී.ඊ.ය යුධමය වශයෙන් පරාජය කිරීමට සැලසුම් සකස් කරන විට ඉහත ආකාරයේ මුදල් විශුද්ධිකරණ කටයුතු ද වළක්වාලීමේ අවශ්‍යතාවක් ශ්‍රී ලංකා රජයට තිබුණි. එතෙක් ශ්‍රී ලංකාවේ විනිමය පාලන පනත, බැංකු පනත, රේගු පනත ආදියෙන් වක්‍ර ව මුදල් විශුද්ධිකරණයට එරෙහි ව විවිධ පියවර ගෙන තිබුණ ද එය ප්‍රමාණවත් නො වන හෙයින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට ඍජු පනත් දෙකක් සම්මත කරන ලදී.

1. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
2. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

ඊට අමතර ව 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත මගින් ද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට ඍජු දායකත්වයක් ලැබේ.

2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත මගින් මුදල් විශුද්ධිකරණයට අයත් වන වැරදි හා දඬුවම් පිළිබඳ ව නීතිමය පසුබිම පැහැදිලි කර ඇත. ඒ අනුව අපරාධවලින් හෝ නීත්‍යානුකූල නො වන මාර්ග හරහා මුදල් හෝ දේපළ ඉපයීම, ඒවා ළඟ තබා ගැනීම, පරිහරණය කිරීම, බැහැර කිරීම, භාර ගැනීම ආදිය මුදල් විශුද්ධිකරණයට ඇතුළත් වන වැරදි කිහිපයකි. මේ හැරුණු විට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි, විදේශ විනිමයට අදාළ වැරදි, පිරමීඩාකාර ගනුදෙනු, අන්තර් ජාතික සංවිධානාත්මක අපරාධ, අන්තර්ජාලය ආශ්‍රිත අපරාධ, ළමයින්ට එරෙහි අපරාධ, මිනිස් ජාවාරම, රේගු ආඥා පනතට අදාළ වැරදි ආදිය ද මුදල් විශුද්ධිකරණ පනත ඔස්සේ දඬුවම් ලැබිය හැකි වැරදි ලෙස පෙන්වා දී ඇත. මෙම පනතට අදාළ ව ඉහත මොනයම් ආකාරයේ හෝ වරදකට මහාධිකරණය විසින් වරදකරු යැයි තීන්දු කළහොත්, වසර 5 - 20 අතර කාලයක් සිර දඬුවම් ලබා දීම, දේපළ රාජසන්තක කිරීම, දේපළ වටිනාකම මෙන් තුන් ගුණයක් දඩ නියම කිරීම වැනි දඬුවම් පැමිණ විය හැකි ය. මෙම පනත පිළිබඳ ව විග්‍රහ කරන විට අවබෝධ වන්නේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ නීතිමය පසුබිම සහ අධිකරණ ක්‍රියාවලිය ස්ථාපනය කිරීම ඉන් සිදු වන බවය. රටක් වශයෙන් ජාතික මූල්‍ය පද්ධතිය තුළ මූල්‍ය විශුද්ධිකරණය සිදු වන්නේ ද, එවැන්නක් සිදු වන්නේ නම් ඊට අදාළ තොරතුරු ලබා ගැනීමට ඒවා වළක්වා ගැනීම සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ සකස් කිරීමට ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. එහෙත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ඔස්සේ එ වැනි ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කොට නැති අතර වෙනත් පනතක් මගින් ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ඇත.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් උක්ත ආකාරයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ජාතික යාන්ත්‍රණය ස්ථාපනය කරන ලදි. මේ කාලය වන විට බොහෝ රටවල් මෙ වැනි ජාතික ආයතන ස්ථාපනය කර තිබූ අතර UNODC, එග්මන්ට් සමූහය, මූල්‍ය සාධක කාර්ය බලකාය වැනි ජාත්‍යන්තර සංවිධාන මගින් ද සාමාජික රාජ්‍යයන්ට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව ජාතික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබිණි. ඒ අනුව 2006 මාර්තු මාසයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය හෙවත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ජාතික යාන්ත්‍රණය මුදල් ගනුදෙනු

වාර්තා කිරීමේ පනත ප්‍රකාර ව පිහිටුවන ලදී. මෙය මෙරට මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ව ගන්නා ලද යෝධ පියවරක් ලෙස හඳුන්වා දිය හැකි ය. ජනාධිපතිවරයාගේ නියෝගයකට අනුව 2007 පෙබරවාරි මාසයේ සිට මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලදී.

**මූල්‍ය බුද්ධි ඒකකය**

ඉහත නෛතික විධිවිධානය ඇසුරෙන් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකයෙහි අරමුණ හා කාර්යයභාරය පිළිබඳ ව පාඨක අවධානය යොමු කිරීම මීළඟට සිදු වේ. ඒ අනුව මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීමේ මූලික අරමුණ වන්නේ ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසීන්ට අදාළ ව මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමෙහිලා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක් ම ගැනීමයි. මෙම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් විවිධ කාර්යයන් සිදු කරනු ලබයි. මේ අනුව මුදල් ගනුදෙනු, විද්‍යුත් මුදල් ගනුදෙනු සහ සැක කටයුතු ගනුදෙනු පිළිබඳ මූල්‍ය ආයතනවලින් වාර්තා ලබා ගැනීම මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයකි. උක්ත කාර්යයට අදාළ ව 2014 දෙසැම්බර් මස 31 වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 25කින් ද, බලපත්‍රලාභී විශේෂිත බැංකු 9කින් ද, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 48කින් ද, රක්ෂණ සමාගම් 21කින් ද, කොටස් තැරැව්කාර සමාගම් 35කින් ද, බලයලත් මුදල් හුවමාරුකරුවන් 70කින් ද වාර්තා හා තොරතුරු ලබා ගැනීම මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කෙරිණි. මේ පිළිබඳ ව තවදුරටත් පැහැදිලි කිරීමේ දී මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15 වන වගන්තිය ප්‍රකාර ව දත්ත ලබා ගැනීම, ඒවා විශ්ලේෂණය කිරීම, පර්යේෂණ සිදු කිරීම හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම ආදිය ද මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යයභාරයට අයත් බව හඳුනා ගත හැකි ය. එ මෙන් ම ශ්‍රී ලංකා මූල්‍ය පද්ධතියේ විවිධ ආයතනයන්ට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ විවිධ රීති හා මාර්ගෝපදේශ නිකුත් කිරීම, ඒවා නිසි අයුරින් එම ආයතන පිළිපදින්නේ දැයි සොයා බැලීම ආදිය ද එහි කාර්යයන්ට අදාළ තවත් ක්ෂේත්‍රයන් වේ. මේ හැරුණු විට ජාතික මූල්‍ය පද්ධතියේ සේවක සේවිකාවන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ දැනුම වැඩි දියුණු කිරීම, ඊට අදාළ ධාරිතාව ඉහළ නැංවීම ආදිය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, දේශීය ජාත්‍යන්තර සංවිධාන අතර ගිවිසුම් හා සම්මුතීන්ට එළඹීම වැනි කාර්යයන් ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් කරගෙන යනු ලබයි. මෙම කරුණුවලට අනුව පැහැදිලි වන්නේ මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමේ අරමුණට අදාළ ව මූල්‍ය බුද්ධි ඒකකය විසින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශාල කාර්යයභාරයක් සිදු කර ගෙන යනු ලබන බවයි.

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය පිළිබඳ ව ලෝක බැංකුවේ ආකෘතියට අනුව මෙරට මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඇගැයීමක් සිදු කර ඇත. එම වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය සැලකිය යුතු අයුරකින් ප්‍රගතියක් ලබා ඇති බවත් එහෙත් එකී තත්ත්වය තවදුරටත් ඉහළ නැංවිය යුතු බවත් සඳහන් කර ඇති අතර ඊට අදාළ විවිධ නිර්දේශ ඉදිරිපත් කිරීම ද සිදු කර ඇත. එම වාර්තාව සකස් කිරීමේ දී ජාතික මූල්‍ය පද්ධතියේ විවිධ ආයතන මෙන් ම මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමට අදාළ නෛතික හා ප්‍රතිපත්ති රාමුව ද විමර්ශනයට ලක් කර ඇත. එහි එක් ප්‍රධාන නිරීක්ෂණයකට අනුව ශ්‍රී ලංකා මූල්‍ය පද්ධතියේ විශාල ම පංගුවකට උරුමකම් කියන බැංකු පද්ධතියෙහි මූල්‍ය විශුද්ධිකරණයට අදාළ අවදානම අනෙකුත් ක්ෂේත්‍රයන්ට සාපේක්ෂ ව එ නම් රක්ෂණ, සුරැකුම්පත්, අවිධිමත් මූල්‍ය අංශය වැනි ඒවාට වඩා පහළ අගයක් ගන්නා බව හඳුනා ගෙන ඇත. මීට ප්‍රධාන හේතුව වන්නේ ජාතික බැංකු පද්ධතිය විධිමත් ව හා සමබර ව සකස් වූවක් හෙයින් එයට අදාළ ව විවිධ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ නියාමන කටයුතු පවත්වා ගෙන යෑම පහසුවීමයි *(National Money Laundering and Terrorist Financing Risk Assessment of Sri Lanka, 2014)*. එහෙත් අනෙකුත් ක්ෂේත්‍රවල දැක ගත හැකි යම් යම් ආකාරයේ අවිධිමත් ස්වරූප හා අස්ථායී බව හේතුවෙන් ඒවා නිරන්තරයෙන් නියාමනය කිරීම අපහසු විය හැකි ය. එ වැනි ආකාරයේ විවිධ නිරීක්ෂණ පදනම් කොට ගෙන ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග ඇගැයීමට ලක් කරන ලද ඉහත වාර්තාව විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම වැඩිදියුණු කිරීමට ද විවිධ නිර්දේශ ඉදිරිපත් කර ඇත. එකී සියල්ල සම්පිණ්ඩනය කළහොත් ඉන් අවධාරණය කර ඇත්තේ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම, මුදල් විශුද්ධිකරණය පිළිබඳ පර්යේෂණ ක්‍රියාවලිය ගුණාත්මක ව හා ප්‍රමාණාත්මක ව ප්‍රවර්ධනය කිරීම, මීට අදාළ ජාතික හා ජාත්‍යන්තර වපසරිය පුළුල් කිරීම, මහජන දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම ආදිය වන බව හඳුනා ගත හැකි ය. *(National Money Laundering and Terrorist Financing Risk Assessment of Sri Lanka, 2014)* උක්ත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී තාක්ෂණ අංශය පිළිබඳ ව ද අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය

වේ. මුදල් විශුද්ධිකරණය යනු සංකීර්ණ මෙන් ම විශාල තාක්ෂණික ඥාණයක් පදනම් වූ ක්‍රියාවලියක් බව මෙම ලිපියේ මුල සිට ම අවධාරණය කරන ලදි. ඒ අනුව මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියෙන් ශ්‍රී ලංකාවේ ජාතික මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගැනීමට තාක්ෂණය හා නව පර්යේෂණාත්මක දැනුම පදනම් වූ ක්‍රියාවලියක් ලෙස දැනට පවතින මුදල් විශුද්ධිකරණයට එරෙහි ජාතික ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළ යුතු බව පෙන්වා දිය හැකි ය.■

**මූලාශ්‍ර:**


විජේසූරිය ඩී.කේ. (2016)


කළු සල්ලි සුදු කිරීමේ ප්‍රතිවිපාකය මුදල් විශුද්ධිකරණය, දෙසතිය සඟරාව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

*Money Laundering and Financial Crimes Country Database, 2015*

වාර්ෂික වාර්තාව, මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව


# තහනම් පිරමීඩ යෝජනා ක්‍රමයක් යනු කුමක් ද?



**කෙනෙකු විසින් යම් මුදලක් ගෙවා සාමාජිකත්වය ලබාගෙන තවත් සාමාජිකයන් බඳවා ගැනීම තුළින් ආදායම් ලබාගැනීමට යෝජනා කරන ක්‍රමයක් පිරමීඩ යෝජනා ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය.**

- යම් කෙනෙක් ඔබට අඛණ්ඩව විශාල ප්‍රතිලාභ ලබාගැනීමට මෙසේ යෝජනා කරයි ද?
  - රන් කාසි, පෙන්ඩන්ට්, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ, සූර්ය කෝෂ, වන්දනා චාරිකා වැනි භාණ්ඩ හා සේවාවන් මිලදී ගෙන සාමාජිකයකු වන ලෙස
  - එලදායී නිෂ්පාදන හෝ සේවාවන් ඉටු නොකොට තවත් සාමාජිකයින් බඳවා දීමෙන් පමණක් අති විශාල ආදායම් ලබා ගත හැකි බව පැවසීම

**මේවා තහනම් පිරමීඩ යෝජනා ක්‍රම වේ.**

**තවත් සාමාජිකයින් බඳවා ගැනීමට නොහැකි වීමෙන් ඉතා ඉක්මනින් මෙම ජාලය කඩා වැටෙනු ඇත.**

- 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වගන්තිය යටතේ මෙවැනි යෝජනා ක්‍රම සඳහා සහභාගී වීම, ප්‍රචාරණය, මුදල් යෙදවීම නීති විරෝධී වේ.
- "මෙවැනි තහනම් යෝජනා ක්‍රම වලින් උපයනු ලබන මුදල් හා එම මුදලින් අත්පත් කරගනු ලබන දේපළ පිළිබඳ සාජුව හෝ වක්‍රව ගනුදෙනුවලට එළඹීම මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත අනුව ද නීති විරෝධී වේ."

මෙවැනි නීති විරෝධී යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමෙන් **වසර 5 ක් දක්වා සිර දඬුවම්** සහ රුපියල් ලක්ෂ විස්සක් හෝ වංචාවට සම්බන්ධ වී ඉපයූ මුළු මුදල මෙන් දෙගුණයක දඩ මුදලක් ගෙවීමට සිදුවිය හැක.



වංචාකාරී වූ මෙවැනි යෝජනා ක්‍රමවලට හසුවී අමාරුවේ වැටෙන්න එපා.

මෙවැනි අය පිළිබඳ තොරතුරු ඇතොත් ළඟම ඇති පොලීසියට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ පහත දුරකථන අංකවලට දැනුම් දෙන්න.

**0112 398542, 0112 398762**

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මූලික ව්‍යුත්පන්න උපකරණ හා අවදානම් කළමනාකරණය

**ඩබ්.ආර්.එම්.කේ. ප්‍රනාන්දු**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**
**අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

### ව්‍යුත්පන්න උපකරණ

ආයෝජන කළමනාකරණය තුළ දැකිය හැකි එයට ම ආවේණික වූ සංකල්පයක් ලෙස "අවදානම" හඳුනා ගත හැකි ය. එම නිසා ම ආයෝජන කළමනාකරුවෝ නිරන්තරයෙන් තම ආයෝජන සමඟ බද්ධ ව ඇති අවදානම් හඳුනා ගැනීමට, එය මැනීමට මෙන් ම පාලනය කිරීමට ද උත්සාහ කරති. අවදානම මැනීම සඳහා සම්භාවිතා න්‍යායන් ඇතුළු ගණිතමය ක්‍රම යොදා ගැනේ.

මේ සඳහා සරල උදාහරණයක් ලෙසට විවිධ සුරැකුම්පත් හා බැඳුම්කරවලින් පමණක් අපගේ ව්‍යාපාරික වෙළෙඳපොළ සමන්විත වන්නේ යයි උපකල්පනය කරමු. එම නිසා එහි දී එම සුරැකුම්පත් හා බැඳි අවදානම් වන්නේ, සුරැකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම වෙනස්වීමේ අවදානම හා බූන්වත් බවට පත්වීමේ අවදානම යන ඒවා ය. එම අවදානම් පාලනය කිරීමේ අරමුණින් මූල්‍ය කළමනාකරුවන් විසින් විවිධ ආයෝජන මාධ්‍යවල ආයෝජනය කිරීම හෙවත් ආයෝජන සඳහා එක ම සමාගමක සුරැකුම්පත්වල නො යොදා විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරවල නියුතු සමාගම් කිහිපයක් අතර බෙදා හැරීම මෙන් ම රජයේ සුරැකුම්පත් වැනි පැහැර හැරීමේ අවදානම් රහිත ආයෝජන මාධ්‍ය තෝරා ගැනීම සිදු කරනු ලැබිය හැකි යි.

නමුත් ප්‍රායෝගික ව එබඳු සුරැකුම්පත් පමණක් ඇති සරල මූල්‍ය වෙළෙඳපොළක් දැකිය නො හැකි යි. සුරැකුම්පත් වෙළෙඳපොළ, විනිමය වෙළෙඳපොළ, මුදල් වෙළෙඳපොළ, භාණ්ඩ වෙළෙඳපොළ ආදී විවිධ වූ වෙළෙඳපොළවල් රාශියකින් හා විවිධ මූල්‍ය උපකරණවලින් සමන්විත මූල්‍ය පරිසරයක් වර්තමානයේ නිර්මාණය වී ඇත. මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් වන වෙළෙඳ වටිනාකම් වෙනස්වීම්, මුදල් ප්‍රවාහ වෙනස්වීම්, භාණ්ඩ මිල වෙනස්වීම් මෙන් ම මූල්‍ය වෙළෙඳපොළ තුළ ඇති විය හැකි උච්ඡාවචනයන් නිසා ඇති විය හැකි අවදානම් අවම කිරීමේ අරමුණින් ව්‍යුත්පන්න උපකරණ වෙළෙඳපොළ (Derivative Market) බිහි වී ඇත. මේ අනුව ව්‍යුත්පන්න යනු එයට සම්බන්ධ වත්කම නැතහොත් ආශ්‍රිත වත්කමේ අගයේ උච්ඡාවචනයට අනුව ආශ්‍රිත හිමි වන මූල්‍ය උපකරණයක් ලෙස හැඳින්විය හැකි යි. එම ආශ්‍රිත වත්කම ලෙස දෘශ්‍ය භාණ්ඩයක්, පොලී ප්‍රවාහයක්, සමාගම් කොටස්, විනිමය ඒකකයක් හෝ වෙනත් හුවමාරු ප්‍රභවයක් නියෝජනය කරයි.

මෙම වෙළෙඳපොළ තුළ ව්‍යුත්පන්න උපකරණ හුවමාරු වන ආකාරය අනුව වර්ග කිරීමක් දැකිය හැකි යි. ඒවා නම්,

1. හුවමාරු මධ්‍යස්ථානයන් හරහා අලෙවි වන ව්‍යුත්පන්න උපකරණ (Exchange Traded)
2. කවුන්ටරය මත වෙළෙඳාම් වන ව්‍යුත්පන්න උපකරණ (Over thd Counter - OTC)

### හුවමාරු මධ්‍යස්ථානයක් හරහා වෙළෙඳපොළේ අලෙවි වන ව්‍යුත්පන්න උපකරණ

මේවා වඩාත් සංවිධිත වෙළෙඳපොළක අලෙවි වන ව්‍යුත්පන්න උපකරණ ලෙස සැළකිය හැකි යි. ඉහළ සංවිධාන ව්‍යුහයක් තුළ සුපරීක්ෂණයක් යටතේ වෙළෙඳාම සිදු කෙරේ. වෙළෙඳපොළ සහභාගීවන්නන් හුවමාරු මධ්‍යස්ථානයේ සඳහන් නීති රීති, කොන්දේසිවලට අනුකූල ව මිල දී ගැනීම්, අලෙවි කිරීම් සිදු කරයි. දෛනික ව වෙළෙඳපොළ ලකුණු කිරීම සිදු කෙරෙන නිශ්කාෂණ අංශයක් තිබීම ද මෙහි ඇති විශේෂත්වයකි. ඒ අනුව හුවමාරු මධ්‍යස්ථානය හරහා ව්‍යුත්පන්න උපකරණ අලෙවි

කිරීමේ දී වෙළෙඳාමේ නියුතු පාර්ශ්ව නිශ්කාෂණ නීතිරීති අනුව කටයුතු කළ යුතු වන අතර "ආන්තික ගිණුම" නමින් වූ නාමමාත්‍ර ගිණුමක් තම නමින් විවෘත කොට එහි තම ආයෝජනය මත පදනම් ව හුවමාරු මධ්‍යස්ථානය විසින් නියම කෙරෙන මුදලක් තැන්පත් කළ යුතු යි. සිදු කරන ලද ආයෝජනයන් දෛනික ව "වෙළෙඳපොළ ලකුණු කිරීම" (Mark - to - Market) සිදු කෙරෙන අතර එහි අදහස වන්නේ දවස අවසානයේ දී එම ආයෝජනවල වෙළෙඳපොළ අගය තීරණය කොට ලාභ පාඩු ගණනය කිරීමයි. එම ලාභය හෝ පාඩුව අනුව ආන්තික ගිණුමේ ඇති මුදල් ශේෂය ප්‍රමාණවත් නො වන විට අදාළ ආයෝජකයාට මුදල් තැන්පත් කරන ලෙස දැනුම්දීමක් සිදු කරයි. එම දැනුම්දීම "ආන්තික දැනුම්දීම" නැතහොත් "Margin Call" ලෙස හඳුන්වයි. ඒ තුළින් සිදු විය හැකි අලාභදායී තත්ත්වයන් නැතහොත් අවදානම් පාලනය කිරීම සිදු කරයි. කෙසේ නමුත් හුවමාරු මධ්‍යස්ථානයක් හරහා අලෙවි වන ව්‍යුත්පන්න උපකරණ සඳහා වන අවදානම දරන්නේ හුවමාරු මධ්‍යස්ථානය විසිනි. අලෙවිකරුවන් ව්‍යුත්පන්න උපකරණ අලෙවි කරන්නේ හුවමාරු මධ්‍යස්ථානයට වන අතර ගැනුම්කරුවන් මිල දී ගන්නේ හුවමාරු මධ්‍යස්ථානයෙනි. එ සේ නොමැති ව අලෙවිකරුවන් හා ගැනුම්කරුවන් අතර සෘජු වෙළෙඳාමක් මෙහි දී සිදු නො වේ.

මේ අනුව හුවමාරු මධ්‍යස්ථානයක් මත පදනම් වූ වෙළෙඳපොළවල ලක්ෂණ පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැකි යි.

1. වෙළෙඳාම් කරනු ලබන ගිවිසුම් සම්මත ප්‍රමිති, සම්මත ප්‍රමාණ, සම්මත ඒකක මිල ලංසු තුළින් වෙළෙඳාම් කිරීමට හැකි වීම
2. ගිවිසුම් වලංගු වන කාලය නැතහොත් පරිණත දිනය, මුදල් ඒකක වර්ගය, වෙළෙඳපොළ විවෘත ව තැබෙන වේලාවන් ආදිය විධිමත් ලෙස හුවමාරු මධ්‍යස්ථානය විසින් තීරණය කොට තිබීම
3. ආයතනික රාමුවකින් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම
4. නිශ්කාෂණ නීතිරීතිවලට හා ආන්තර අවශ්‍යතාවලට යටත්වීම
5. දෛනික ව වෙළෙඳපොළට ලකුණු කිරීම සිදු කිරීම හා ඒ අනුව ආන්තර අවශ්‍යතා පැනවීම
6. තැරැවුකරුවන් සංවිධානය කොට තිබීම
7. හුවමාරු මධ්‍යස්ථානයේ මිල ගණන් සැමට ම විවෘත නිසා මිල ගණන් කෙරෙහි බලපෑමක් සිදු වීම

## හුවමාරු මධ්‍යස්ථානයක් හරහා කෙරෙන ගනුදෙනුවල වාසි

1. ආන්තික ලකුණු කිරීම නිසා ගිවිසුම්වල ඇති අවදානම අඩුවීම
2. මිල ගණන් පාරදෘශ්‍ය වීම (Transparency)
3. ද්‍රවශීලතාව සංකේන්ද්‍රණය වූ වෙළෙඳපොළක් වීම
4. අවසාන වගකීම භාර ගැනීමට හුවමාරු මධ්‍යස්ථානය තිබීම

## හුවමාරු මධ්‍යස්ථානයක් හරහා කෙරෙන ගනුදෙනුවල අවාසි

1. නීතිරීති රෙගුලාසිවලට අනුව ප්‍රමිතිගත වූ ගිවිසුම් වීම
2. තම අවශ්‍යතා හා ගිවිසුම්වල ඇති කොන්දේසි සම නො වීම
3. දිගු කාල පරිණතියක් ඇති ගිවිසුම්වලට එළඹිය නො හැකි වීම

### කවුන්ටරය මත වෙළෙඳාම් වන ව්‍යුත්පන්න උපකරණ

ලෝකයේ විශාලතම ගනුදෙනු සිදු වන විදේශ විනිමය වෙළෙඳපොළ අයත් වන්නේ කවුන්ටරය මත වෙළෙඳාම් සිදු වන ව්‍යුත්පන්න උපකරණ වෙළෙඳපොළට ය. පාර්ශ්වවලට අවශ්‍ය පරිදි, ගිවිසුම් කොන්දේසි ඇති කර ගත හැකි වන අතර බැංකු දුරකථන, ෆැක්ස් පණිවිඩ හා රොයිටර්, බ්ලූම්බර්ග්, නයිට්රයිඩර් වැනි පරිගණක තිර ඔස්සේ එකිනෙකා සමඟ ගනුදෙනු සිදු වේ. ඒ අනුව කවුන්ටරය මත වෙළෙඳාම් සිදු වන ව්‍යුත්පන්න වෙළෙඳපොළක පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි යි.

1. බැංකු, දුරකථන, ෆැක්ස් සහ පරිගණක තිර තුළින් නිර්මාණය වී ඇති වෙළෙඳපොළක් වීම
2. පරිගණක තිර ආශ්‍රයෙන් හා මිල කථන වෙළෙඳුන් (Quote Vendors) තුළින් ගැනුම් මිල, විකුණුම් මිල ලබා ගත හැකි වීම

3. හුවමාරු මධ්‍යස්ථානයක අධීක්ෂණයට යටත් නො වීම

## කවුන්ටරය මත ව්‍යුත්පන්න වෙළෙඳාමේ වාසි

1. පාර්ශ්වකරුවන්ට අවශ්‍ය පරිදි අවශ්‍ය වන ප්‍රමාණයට, කල් පිරීමේ කාලයට (පරිණතියට) අනුව ගිවිසුම් ඇති කර ගත හැකි වීම
2. එකිනෙක ගනුදෙනු තුළින් වෙළෙඳපොළ මිල වෙත කෙරෙන බලපෑම අඩු වීම
3. මහ බැංකුවේ නියාමකයින්ගේ පරීක්ෂාවට ලක්වීම නිසා බැංකුවක් හරහා විනිමය, පොලී, මුදල් හුවමාරු සඳහා අවදානම් අඩු වීම

## කවුන්ටරය මත ව්‍යුත්පන්න වෙළෙඳාමේ අවාසි

1. ප්‍රතිපාර්ශ්වීය අවදානම අඩු කෙරෙන පරිදි කටයුතු කෙරන නිශ්කාෂණ ආයතන හරහා ගනුදෙනු සිදු නො වීම
2. දිනපතා වෙළෙඳපොළට ලකුණු කිරීම තුළින් ආන්තර අවශ්‍යතා තීරණය නො කෙරන නිසා ප්‍රතිපාර්ශ්වීය අවදානම ඉහළ වීම
3. මිල ගණන් පාරදෘශ්‍ය නොවීම
4. ලියකියවිලි සංකීර්ණ ඒවා වීම

වෙළෙඳපොළ තුළ බහුල ව යොදා ගැනෙන ව්‍යුත්පන්න උපකරණ පහත සාකච්ඡා කෙරේ.

## ඉදිරි ගනුදෙනු (Forward Contracts)

වර්තමානයේ එකඟ වූ මිලක් මත, අනාගත දිනක දී මිල දී ගැනීම සඳහා යම්කිසි වත්කමක්/ව්‍යුත්පන්න උපකරණයක් සම්බන්ධයෙන් මිල දී ගන්නෙකු හා අලෙවිකරන්නෙකු අතර ඇති කර ගන්නා ගිවිසුමකට ඉදිරි ගිවිසුමක් යයි කියනු ලැබේ.

එම නිසා කලින් ගිවිස ගත් මිලට අනුව අදාළ ගනුදෙනුව සිදු කිරීම දෙපාර්ශ්වයේ ම වගකීමකි. මිල දී ගන්නා Long ලෙස ද, විකුණන්නා Short ලෙස ද පොදුවේ භාවිත කෙරේ. මෙහි දී වැදගත් කරුණක් වන්නේ ගිවිසුම ආරම්භ කරන විටෙක මුදල් හුවමාරුවක් සිදු නො වීම යි.

උදා : විශ්‍රාම අරමුදල් කළමනාකරුවෙකු ඉදිරි මාස 3කින් තම අරමුදල් යොදා යම් ව්‍යාපාරයක කොටස් මිල දී ගැනීමේ ඉදිරි ගිවිසුමකට එළඹීම

ඔහු අපේක්ෂා කරන්නේ තවත් මාස 3කින් ගිවිස ගත් මිලට වඩා වැඩි මිලක් එක් කොටසක් සඳහා පවතී ය යන්නයි. යම් ලෙසකින් සත්‍ය කොටස් මිල ගිවිස ගත් මිලට වඩා අඩු වුවහොත් ඔහුට පාඩුවක් සිදු වේ. නමුත් එකඟ වූ මිලට මිල දී ගැනීමට ඔහු බැඳී සිටී.

ඉදිරි ගිවිසුමක් කල් පිරීමේ දී මුදල් ගෙවීම පහත ක්‍රම දෙකකින් එකක් යටතේ සිදු විය හැකි යි.

01. භාරදීම (Delivery)

    Long විසින් එකඟ වූ මුදල Short වෙත භාරදීමත්, Short විසින් භාණ්ඩ Long වෙත භාරදීමත් සිදු වේ.

02. මුදලින් පියවීම (Settlement)

ශුද්ධ මුදල් ප්‍රවාහය පාර්ශ්ව දෙකකින් එක් පාර්ශ්වයක් වෙත මුදලින් ගෙවීම යි (Non - Deliverable Forwards).

ඉදිරි ගිවිසුම්වල ඇති පැහැර හැරීමේ අවදානම යනු මුදලින් පියවන ගිවිසුමක දී නම්, සෑම විට ම වැඩි වටිනාකමක් හොබවන පාර්ශ්වය විසින් පැහැර හැරීමට ඇති අවදානමයි. කාලය ඉකුත් වීම දක්වා ම පවත්වා ගැනීමෙන් හෝ ඊට ප්‍රථම වෙනත් ගිවිසුමකට එයට ප්‍රතිවිරුද්ධ ලෙස එළඹීම තුළින් ඉදිරි ගිවිසුම අවසන් කිරීම සිදු කළ හැකි යි.

## අනාගත ගිවිසුම් (Futures)

අනාගත ගිවිසුම් යනු හුවමාරු මධ්‍යස්ථානයක් හරහා වෙළඳාම් වන එහි ප්‍රමිතිගත නීතිරීතිවලට අනුකූල ව පිළියෙළ කොට ඇති ගිවිසුම් වන අතර වර්තමානයේ එකඟ වූ මිලක් මත අනාගතයේ දී ගනුදෙනු කිරීමට දෙපාර්ශ්වයක් අතර එකඟතාවක් ඇති වේ.

මේ සඳහා ද්විත්ව වෙළෙඳපොළක් ඇති අතර දිනපතා ලාභ පාඩු ගණනය කොට හිමිකරුවන්ගේ ගිණුම් ගැලපීමක් සිදු කරන නිසා පැහැර හැරීමේ අවදානම ඉතා අඩු යි. මේවා ද දෙපැති ගිවිසුම් වේ. එ නම් දෙපාර්ශ්වයට ම බැඳීම් ඇත. ව්‍යාපාර වස්තු දර්ශක (Stock Index Futures), කෙටි කාලීන පොලී අනුපාත,

දිගුකාලීන පොලී අනුපාත, මුදල් වර්ග යනාදී ලෙස අනාගත ගිවිසුම් භාවිත වේ.

අනාගත ගිවිසුම් වෙළඳාම පිළිබඳ ව ප්‍රකාශ කිරීමට දර්ශක දෙකක් යොදා ගනී.

1. **විවෘත අපේක්ෂාව** : එ නම් තවමත් විවෘත ව ඇති, නැතහොත් අවසන් කර නොමැති (හිලව් වී නොමැති) ගිවිසුම්

2. **වෙළෙඳාම් ප්‍රමාණය** : යම් කාලයක් තුළ වෙළෙඳාම් කළ ගනුදෙනු ප්‍රමාණය

ගෙවා ගිවිසුමක් මිල දී ගැනීමෙන් "අයිතියක්" හිමි කර ගනී. ගැනුම්කරුට පාඩු විය හැකි උපරිමය එම ගැනුම් මිල (Premium) යි. විකුණන්නාට ලැබිය හැකි ලොකුම ලාභය ද එයයි.

**විකල්ප ගිවිසුම් වර්ග (Types of Option Contracts)**

- ඇරයුම් විකල්ප (Call Options) හා ගැනුම් විකල්ප (Put Options)

**ඇරයුම් විකල්ප**

මෙම විකල්ප ගිවිසුම තුළින් මිල දී ගන්නා වෙත එකඟ වූ මිලකට අනාගතයේ එකඟ වූ කාල

**ඉදිරි ගිවිසුම් හා අනාගත ගිවිසුම් අතර වෙනස**

| | ඉදිරි ගිවිසුම් | අනාගත ගිවිසුම් |
|---|---|---|
| 1. වෙළඳාම සිදු වීම (Trading Location) | සංවිධානය වූ හුවමාරු මධ්‍යස්ථානයක දී සිදු වේ | බැංකුකරුවෙකු විසින් මෙහෙයවන අතර දුරකතන, ෆැක්ස් තුළින් වෙළෙඳාම සිදු වේ |
| 2. ගිවිසුමේ විශාලත්වය (Contract Size) | සහභාගීවන්නන්ගේ අවශ්‍යතාව මත තීරණය වේ | නියමිත පරිදි ප්‍රමිතියකට අනුකූල ව හුවමාරු මධ්‍යස්ථානය තීරණය කරයි |
| 3. පියවීම/ කාලය (Settlement) | ගිවිසුම් ප්‍රකාර ව බැංකුව මැදිහත් වී නියම කර ගත් මිලට විකිණීම හෝ මිල දී ගැනීම | දෛනික ව හුවමාරු මධ්‍යස්ථානය විසින් වෙළෙඳපොළට ලකුණු කිරීම මත |
| 4. වලංගු කාලය (Expire) | දෙපාර්ශ්වයේ අවශ්‍යතාව මත තීරණය කර ගත් දිනවල දී | හුවමාරු මධ්‍යස්ථානය විසින් කලින් ම තීරණය කර ඇත. |
| 5. භාරදීම (Delivery) | බහුල වශයෙන් සිදු වේ | විරල ය. ඒ වෙනුවට විකිණීමට එරෙහි ව මිල දී ගැනීම සිදු වේ. |

**විකල්ප ගිවිසුම් (Options)**

ගිවිසුමේ එකඟ වූ මිල ගණනකට යම් වත්කමක් අනාගතයේ දී මිල දී ගැනීම හෝ විකිණීම එම ගිවිසුම දරන්නාට හිමි වන අයිතියක් මිස වගකීමක් නො වේ. මෙම අයිතිය හිමි කර ගැනීම උදෙසා ගිවිසුම මිල දී ගන්නා මිලක් (Premium) ගෙවිය යුතු අතර, එය දරන්නා ක්‍රියාත්මක කරන විට ගරු කිරීමට ගිවිසුම විකුණන්නා බැඳී සිටී. එම නිසා තනි පැත්තේ ඔට්ටු ලෙස මෙම විකල්ප ගිවිසුම් හඳුන්වයි. එ නම් එහි ආශ්‍රිත අසමමිතික වේ. විකල්ප මිල දී ගන්නෙකු මිලක්

වකවානුවක දී ආශ්‍රිත වත්කම මිල දී ගැනීමේ අයිතිය ලැබේ.

**ගැනුම් විකල්ප**

විකල්ප (අධි) මිලක් ගෙවා ගැනුම් විකල්පයක් හිමි කර ගන්නා පාර්ශ්වය වෙත එකඟ වූ මිලක් මත අනාගත කාල වකවානුවක දී ආශ්‍රිත වත්කම විකිණීමේ හිමිකම ලැබේ.

- ඇමරිකානු හා යුරෝපීය විකල්ප (American Options and European Options)

  ඇමරිකානු විකල්ප හිමි කර ගත් අයෙකුට එම විකල්පයේ ජීවිත කාලය තුළ ඕනෑ ම වෙලාවක එය ක්‍රියාත්මක කිරීමේ හිමිකම ලැබේ.

  නමුත්, යුරෝපීය විකල්ප ක්‍රියාත්මක කළ හැක්කේ ඒවායේ ජීවිත කාලය අවසානයේ දී එ නම් පරිණත වූ විට ය.

- පොලී අනුපාත විකල්ප
  මේ යටතේ කැප්ස් (Caps), ෆ්ලෝර්ස් (Floors) සහ කොලර්ස් (Collars)

**කැප්ස්**

ක්‍රියාත්මක කිරීමේ අනුපාතිකයට වඩා වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ ගිය විටෙක ගිවිසුම මිල දී ගන්නා ස්ථාවර පොලී අනුපාතිකයක් ගෙවීම සඳහා ගිවිසුමක් ඇති කර ගනී. ණයකරුවන් (Borrower) විසින් මිල දී ගනී. මේ අනුව, කැප්ස් බැංකුවකින් මිල දී ගත් කළ එහි මිල දී ගන්නා එකඟ වූ පොලී අනුපාතිකයට වඩා වෙළෙඳපොළ පොලී අනුපාතිකය වැඩි වූ විට එම වෙනස බැංකුවෙන් ලබා ගනී. එම නිසා ඉහළ යන පොලී අනුපාතිකයෙන් ආරක්ෂා වීමට කැප්ස් මිලදී ගනී.

**ෆ්ලෝර්ස්**

ක්‍රියාත්මක කිරීමේ අනුපාතිකයට වඩා වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ ගිය විටෙක වුව ද ෆ්ලෝර්ස් මිල දී ගන්නා ස්ථාවර පොලී අනුපාතිකයක් ලැබීම සඳහා ඇති කර ගන්නා ගිවිසුමකි. තැන්පත් හිමියන් (Lenders) මෙ බඳු ගිවිසුම් මිල දී ගනී. මේ අනුව, ෆ්ලෝර්ස් බැංකුවකින් මිල දී ගත් කළ එකඟ වූ පොලී

| | | ඇරයුම් | ගැනුම් |
|---|---|---|---|
| 01. ආශ්‍රිත වත්කමේ මිල වෙනස්වීම | මිල වැඩිවීම | ↑ | ↓ |
| | මිල අඩුවීම | ↓ | ↑ |
| 02. ක්‍රියාත්මක කිරීමේ මිල වෙනස්වීම | මිල වැඩිවීම | ↓ | ↑ |
| | මිල අඩුවීම | ↑ | ↓ |
| 03. ඉකුත්වීමට / පරිණතියට ඇති කාලය (Time to Expire) | වැඩිවීම | ↑ | ↑ |
| | අඩුවීම | ↓ | ↓ |
| 04. මිල නම්‍යතාව | වැඩිවීම | ↑ | ↑ |
| | අඩුවීම | ↓ | ↓ |
| 05. වත්කම් හිමියන්ගේ අපේක්ෂිත මුදල් ලැබීම් ඉහළ යාම | | ඇරයුම් විකල්ප මිලදී ගැනීම වෙනුවට වත්කම හිමි කර ගැනීම ලාභදායී නිසා ඇරයුම් මනාප මිල පහත වැටේ | මුදල් ලැබීම් නිසා වත්කම හිමි කර ගැනීමේ අගය වැඩි නිසා ගැනුම් විකල්ප මිල ඉහළ යයි |
| 06. කෙටිකාලීන පොලී අනුපාත | | වත්කම කෙටිව විකුණූ මුදල් ආයෝජනය කරන නිසා මනාප ඇරයුම් මිල ඉහළ යයි | වත්කම සඳහා වැඩිවීම මුදල් සපයා ගැනීම ණයට සිදු වන නිසා ගැනුම් විකල්ප මිල පහත වැටේ |

අනුපාතිකයට වඩා වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ ගිය විටෙක, එම වෙනස බැංකුව ගෙවනු ඇත. පොලී අනුපාතිකය පහළ යාම නිසා තම පොලී ආදායම් අඩු වීම ආවරණය කිරීමට ෆ්ලෝර්ස් මිල දී ගනී.

### කොලර්ස්

පොලී අනුපාතික කොලරය, කැප් හා ෆ්ලෝර් යන දෙකේ සංකලනයකි. එකවිට කැප් හෝ ෆ්ලෝර් එකක් මිල දී ගැනීමක් තමන් එකඟ වූ මිලකට ෆ්ලෝර් හෝ කැප් විකිණීමක් මෙහි දී සිදු වේ. මෙය ණයකරුවන් හා ආයෝජකයන් යන දෙපාර්ශ්වයට ම ව්‍යුත්පන්න පිරිවැය අඩු කොට, ලැබිය හැකි ආශ්‍රිත ද සීමා කිරීමෙන් ලබා ගත හැකි ය.

උදාහරණ ලෙස කැප් සඳහා එකඟ වූ අනුපාතිකය තුළින් ණයකරුවෙකුට පොලී අනුපාතිකය ඉහළ යාමෙන් ආරක්ෂා විය හැක. එ ලෙසින් ම ෆ්ලෝර් විකල්පය තුළින් තමන්ට වාසිදායක ලෙස පොලී අනුපාතිකය වෙනස්වීම කැප කළ යුතු ය.

මෙම ව්‍යුත්පන්න උපකරණ ඇතුළත් මූල්‍ය වෙළෙඳපොළ තුළ මූලික වශයෙන් තුන් ආකාරයක වෙළෙඳුන් දැකිය හැකි වන අතර ඔවුන් පරස්පරිකයින් නොහොත් අවදානම් රහිත ලාභ ලබන්නන් (Arbitragers), ඉදිරි රකින්නන් (Hedgers) හා සමපේක්ෂකයින් (Speculators) නමින් හැඳින්වනු ලබයි. මොවුන් වෙළෙඳපොළ ක්‍රියාත්මක වන ආකාරය එකිනෙකට වෙනස් වේ. වෙළෙඳපොළ මිල වෙනස්කම් වලට ප්‍රතිචාර දක්වමින් ඉතා කෙටි කලක් තුළ එම වෙළෙඳපොළ මිල වෙනස්කම්වලින් ලාභ ඉපයීමට අවදානම් රහිත ලාභ ලබන්නන් ක්‍රියා කරයි. අවදානම් දැරීම වෙනුවට ව්‍යුත්පන්න උපකරණ තුළින් හා ආයෝජන කළඹ (Investment Portfolios) සකස් කිරීම තුළින් අවදානම විතැන් කිරීමට ඉදිරි රකින්නන් ක්‍රියා කරන අතර වෙළෙඳපොළ මධ්‍යම ආශ්‍රිත හිමිකර ගැනීමට ඔවුන් උනන්දුවක් දක්වයි. සමපේක්ෂකයින් සෑම විට ම ඉහළ අවදානමක් දරමින් තත්ත්වයන් (Positions) ගොඩ නගා ගනිමින් ඉහළ ආශ්‍රිත හිමිකර ගැනීමට උත්සුක වෙති.

### අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සිදු කෙරෙන ආකාරය වෙළෙඳපොළ හා ආයතන ස්වභාවය අනුව වෙනස් විය හැකි ය. උදාහරණ ලෙස අවදානම් භාරගැනීම තම ව්‍යාපාර කර ගත් මූල්‍ය ආයතන සහ අරමුදල් කළමනාකරණය සිදු කරන පෞද්ගලික ව්‍යාපාර ඒකක විසින් ඉහළ අවදානම් දරමින් සිය අරමුණ වන ලාභ කරා ළඟාවීමට උත්සාහ දැරීම දැක්විය හැකි ය. සිය සමානයන් (Peer Groups) සමඟ ඇති තියුණු තරග සමඟ අවදානමට මුහුණ දෙමින් ඉහළ ලාභ වාර්තා කිරීමට ලාභ අරමුණු කර ගත් සියලු ම ආයතන උත්සාහ කරති.

ඒ අනුව, සාමාන්‍ය මූල්‍ය වෙළෙඳපොළ ඉහළ අවදානම් සමඟ ඉහළ ආශ්‍රිත සංකල්පයට අනුව යමින් අවදානම් කළමනාකරණ සිදු කරයි. මූලික වශයෙන් ආයෝජන කළඹ සකස් කර ගැනීම තුළින් එකිනෙක සහසම්බන්ධතාව (Co-relation) අඩු අයෝජන මාධ්‍ය තුළ බෙදා ගැනීම හා ව්‍යුත්පන්න උපකරණ වෙළෙඳපොළ උපකරණ තුළින් තමන් මුහුණ දෙන ආයෝජන අවදානම් කළමනාකරණයට යොමු වේ.■

# ගෝලීය නව්‍යතා දර්ශකය-2017

**කමල් මුණසිංහ**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව**

## 1. හැඳින්වීම

'අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නො නගී' යන කුමාරතුංග මුනිදාසයන්ගේ රුවන් වැකියේ පවතින සදාතනික ආර්ථික විද්‍යාත්මක අර්ථය මොනවට විදහා පාමින් නව ලොව සියලු ජාතීන් නව්‍යකරණයන් තම ආර්ථිකයන්හි ගාමක බලවේගයක් ලෙස සලකන්නා සේ ම, එය විද්‍යාත්මක ව මැන බැලීමේ අවශ්‍යතාව ද අවධාරණය කර ඇත. නව්‍යකරණයන්ගේ තත්ත්වය ගෝලීය මට්ටමින් විද්‍යාත්මක ව විමසා බැලෙන ගෝලීය නව්‍යතා දර්ශකය (Global Innovative Index-GII) මෙහිලා කැපී පෙනෙන අතර 2017 වර්ෂය සඳහා ද එය නව මුහුණුවරකින් කරලියට පැමිණ ඇත. මෙම ලිපියේ අරමුණ වන්නේ ගෝලීය නව්‍යතා දර්ශකය සහ එහි සැකැස්මත් ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම් පිළිබඳ වත් විමසා බැලීම ය.

යුරෝපීය ප්‍රජාව (European Communities) සහ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (Organization for Economic Co-operation and Development - OECD) යන සංවිධානවල නිර්වචනයන්ට අනුව නවෝත්පාදනයන්/ නව්‍යකරණයන් ලෙස සලකන්නේ අලුත් හෝ සැලකිය යුතු මට්ටමකින් වැඩිදියුණු කරන ලද නිෂ්පාදනයක්, ක්‍රියාවලියක්, අලෙවිකරණ ක්‍රමයක් මෙන් ම ව්‍යාපාරික අංශයේ කටයුතුවල/භාවිතාවන්හි, ව්‍යාපාරික ස්ථානවල සහ ව්‍යාපාරික බාහිර සම්බන්ධතා යන අංශවල නව සංවිධානාත්මක ව්‍යුහයක් යනාදියයි.

ගෝලීය නව්‍යතා දර්ශකය යනු ලොව දසත බිහිවන නවෝත්පාදනයන්ගේ මට්ටම ප්‍රමාණාත්මක ව මැන බැලීමේ අටියෙන් 2007 වර්ෂයේ කරලියට පැමිණි සංකල්පයකි. මෙම සංකල්පය කිහිප ආකාරයකින් වැදගත්කමක් උසුලයි. ලොව බොහෝ රටවල් තම තමන්ගේ ආර්ථික වර්ධන ක්‍රියාදාමයේ දී නවෝත්පාදන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. එ සේ ම අනෙකුත් රටවල සිදු වන නව්‍යකරණයන් පිළිබඳ ව ද තරගකාරී දෘෂ්ටි කෝණයකින් විමසා බැලීමට පෙළඹේ. ඊට හේතු වන්නේ ලොව යම් රටක බිහි වන නව්‍යකරණයන් පොදුවේ සියලු රටවල ආර්ථික සහ සමාජ සංවර්ධනය සඳහා ඍජු ව හෝ වක්‍ර ව බලපෑම් ඇති කිරීමයි. අනිත් අතට නව ලොව නව්‍යකරණයන් ඉතා පුළුල් වූ පරිසරයක මහා පරිමාණයෙන් සහ වේගයෙන් ව්‍යාප්ත වන්නකි. එ පමණක් නො ව නව්‍යකරණයන් පිළිබඳ ව ලොවට හඳුන්වා දීම සේ ම නව්‍යකරණයන් හා සම්බන්ධ අනෙකුත් පාර්ශ්වයන්ගේ අවධානය සහ පිළිගැනීම ඒ සඳහා ලබා ගැන්ම ද ඉතා වැදගත් ය. මෙ වැනි කරුණු සමූහයක් හේතුවෙන්, GII සංකල්පය ඉතා වැදගත් වූවක් ලෙස සැලකේ. මේ වන විට මෙම දර්ශකය ලොව බිහි වන නවෝත්පාදන පිළිබඳ ව අඛණ්ඩ ඇගැයීම් යාන්ත්‍රණයක් ලෙස ද, නව්‍යකරණයන් පිළිබඳ ව උනන්දුව දක්වන ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත නොරතුරු සම්පාදනය කෙරෙන මෙවලමක් ලෙස ද ක්‍රියා කෙරේ. කෙසේ වෙතත් මෙම දර්ශකය මගින් නවෝත්පාදන බිහි විය හැකි පරිසරය පිළිබඳ ව විමසා බැලීම හැර නවීකරණයන් අනුව ඒ ඒ රටවල සංවර්ධිත මට්ටම හෝ රටවල් කාණ්ඩගත කිරීමක් සිදු නො කෙරේ. එ සේ ම මෙම දර්ශකය සම්පාදනය කරන්නන්ගේ අපේක්ෂාව වන්නේ නව්‍යකරණයන් වඩාත් තාත්ත්වික ව හඳුනා ගැනීම සඳහා උචිත, වැඩිදියුණු වූ රාමුවක් තුළ දර්ශකය පිළියෙළ කිරීමයි. ඒ අනුව අනාගතයේ දී තවදුරටත් වැඩිදියුණු වූ දර්ශකයක් අපේක්ෂා කළ හැකි ය. GII සඳහා 2017 වසරේ රටවල් 127ක් සලකා බලා ඇති

අතර මෙම රටවල ජීවත් වන ජනගහනය සමස්ත ලෝක ජනගහනයෙන් සියයට 92.5ක් සහ ලෝක දළ ජාතික ආදායමෙන් සියයට 97.6ක් ද නියෝජනය කරයි.

### 2. ගෝලීය නව්‍යතා දර්ශකයේ සැකැස්ම

GII ගොඩ නැගෙන්නේ ප්‍රධාන උප අංශ දෙකක් යටතේ ය. නව්‍යකරණයන් සම්බන්ධ ආදාන උප දර්ශකය (Inputs) සහ ප්‍රතිදාන (Outputs) උප දර්ශකය එම උප අංශ දෙකයි.

1. ආදාන උප දර්ශකය - මෙහි දී ජාතික ආර්ථිකය තුළ නව්‍යකරණයන් බිහි විය හැකි පරිසරයක පවතින ආදාන අනු කොටස් පහක් පිළිබඳ ව සලකා බැලේ.

2. ප්‍රතිදාන උප දර්ශකය - මෙහි දී සලකන්නේ ජාතික ආර්ථිකයේ බිහි වන නව්‍යකරණ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල පිළිබඳ වයි. මේ යටතේ අනු කොටස් දෙකක් පිළිබඳ ව විමසා බැලේ.

ඉහත උප දර්ශක සමාන බර තැබීම් සහිත ව ගණනය කෙරේ.

සටහන - 1

**ගෝලීය නව්‍යතා දර්ශකය**

**නව්‍යතා කාර්යක්ෂමතා අනුපාතය**

- **ආදාන උප දර්ශකය**
  - **ආයතන**
    1. දේශපාලනික පරිසරය
    2. නෛතික රාමුව
    3. ව්‍යාපාර පරිසරය
  - **මානව සම්පත් සහ පර්යේෂණ**
    1. අධ්‍යාපනය
    2. තෘතීයික අධ්‍යාපනය
    3. පර්යේෂණ සහ සංවර්ධන
  - **යටිතල පහසුකම්**
    1. තොරතුරු තාක්ෂණය
    2. පොදු යටිතල පහසුකම්
    3. පාරිසරික තිරසාර බව
  - **වෙළෙඳපොළ විචක්ෂණතාව**
    1. ණය
    2. ආයෝජන
    3. වෙළෙඳ තරගකාරිත්වය සහ පරිමාව
  - **ව්‍යාපාර විචක්ෂණතාව**
    1. දැනුම්වත් ශ්‍රමිකයින්
    2. නව්‍යතා සහසම්බන්ධය
    3. දැනුම උකහා ගැනීම
- **ප්‍රතිදාන උප දර්ශකය**
  - **දැනුම සහ තාක්ෂණික නිමැවුම**
    1. දැනුම නිර්මාණය
    2. දැනුම් ඵල
    3. දැනුම් විසංයෝජනය
  - **නිර්මාණාත්මක නිමැවුම්**
    1. අස්පෘශ්‍ය වත්කම්
    2. නිර්මාණාත්මක භාණ්ඩ සහ සේවා
    3. අන්තර්ජාල නිර්මාණකරණය

3. සමස්ත GII දර්ශකය - මෙ මගින් ඉහත දර්ශක දෙකේ සාමාන්‍යය ගණනය කර දක්වයි.

4. නව්‍යතා කාර්යක්ෂමතා අනුපාතය - මෙය ආදාන උප දර්ශකයට ප්‍රතිදාන උප දර්ශකය දක්වන අනුපාතය පිළිබඳ ව මිනුම වන අතර එ මගින් යම් රටක ආදාන මගින් ලැබෙන ප්‍රතිදාන පිළිබඳ ව අදහසක් ඉදිරිපත් කෙරේ.

ඉහත දැක් වූ ආදාන හා ප්‍රතිදාන උප දර්ශක තවත් උප කොටස් තුන බැගින් නියෝජනය කරයි. එම උප දර්ශක තවත් වෙන් වෙන් වශයෙන් වූ දර්ශක 81 ක් සමඟ ද සම්බන්ධ වී ඇත. GII සකස් කිරීමේ දී ඒ ඒ ආර්ථිකවල ශක්තීන් සහ දුර්වලතා, දත්ත පද්ධති සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව, දත්ත මූලාශ්‍ර හා නිර්වචන සහ විස්තරාත්මක තාක්ෂණික සටහන් යන කරුණු පිළිබඳ ව ද අවධානය යොමු කරයි. එ සේ ම GII ඉදිරිපත් කිරීමේ දී 2011 වසරේ සිට යුරෝපීය ප්‍රජාව සමඟ ද සහසම්බන්ධ වෙමින් ස්වාධීන සංඛ්‍යානමය විගණනයන් ද සිදු කෙරේ.

ඉහත සටහන 1හි ආදාන උප දර්ශකය තුළ පවතින අනෙකුත් දර්ශක කෙටියෙන් විමසා බැලීම වැදගත් වේ. එහි දක්වා ඇති පරිදි ආයතන යටතේ සලකා බැලෙන්නේ නවෝත්පාදන බිහි වීමේ පරිසරයක් ඇති කෙරෙන ආයතනික පද්ධතියක් පවතී ද යන්නයි. එහි දී දේශපාලන ස්ථාවරත්වය, රාජ්‍ය යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව, නීතිමය රාමුවේ ගුණාත්මක බව, නීතියේ ස්වාධිපත්‍යය, රැකියා අහිමිවීම් සඳහා වන්දි ප්‍රදානය, පහසුවෙන් ව්‍යාපාර ආරම්භ කිරීමේ හැකියාව සහ දුර්වල ව්‍යාපාර නැවත ගොඩ නගා ගැනීමේ හැකියාව, බදු ගෙවීමේ පහසුව ආදී කරුණු සලකා බැලේ.

මානව සම්පත් සහ පර්යේෂණ යන කොටසට අයත් වන පළමු උප කොටසින් ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සාධනීය මට්ටම, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස අධ්‍යාපන වියදම්, අධ්‍යාපනය සඳහා රජයේ වියදම, අන්තර්ජාතික ශිෂ්‍ය තක්සේරුකරණ වැඩසටහන (Programme for International Student Assessment - PISA) මගින් සහ ගුරු-සිසු අනුපාතය මගින් මනිනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මක බව විමසා බැලෙන අතර, දෙවන උප කොටස මගින් නව්‍යකරණයන් බිහි වීමේ පරිසරය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරමින් තෘතීයික අධ්‍යාපනයේ මට්ටම සහ වපසරිය, අදහස් සහ දැනුම හුවමාරු කර ගැනීමේ හැකියාව පිළිබඳ ව ද අවධානය යොමු කරයි. තෙවන උප කොටසින් ආවරණය කෙරෙන්නේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්වල ගුණාත්මක මට්ටම වන අතර ලෝක විශ්වවිද්‍යාල වර්ගීකරණය අනුසාරයෙන් විද්‍යාත්මක ආයතනවල ගුණාත්මක තත්ත්වය ද විමසුමට බඳුන් කෙරේ.

යටිතල පහසුකම් යන කොටසින් ආවරණය කෙරෙන්නේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, පොදු යටිතල පහසුකම්, පාරිසරික සුරක්ෂිතතාව යන කරුණු ඔස්සේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව දියුණු වීම තුළ නව්‍යකරණයන් බිහි වීමේ පරිසරය නිර්මාණය වීම යන කරුණු වේ. විචක්ෂණශීලී වෙළෙඳපොළ යන කොටස මගින් නව්‍යකරණයන් සඳහා පහසුකම් සැලැස්වෙන ආකාරයේ මූල්‍යකරණ ප්‍රවේශයන් පැවතීම, අන්තර්ජාතික මූල්‍ය වෙළෙඳපොළට ප්‍රවේශ වීමේ හැකි යාව, තරගකාරිත්වය, වෙළෙඳපොළ පරිමාව යනාදිය සලකා බැලේ.

ව්‍යාපාර විචක්ෂණශීලීබව යන අංගයෙන් ආවරණය කෙරෙනුයේ නවෝත්පාදන බිහිවීම සඳහා ව්‍යාපාරයන්හි පවතින නැඹුරුව සහ ශක්‍යතාව, ඒ සඳහා අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන වියදම් වෙන් කිරීම, මානව සම්පත් උකහා ගැනීම, තරගකාරිත්වය පවත්වා ගැනීම යනාදී කරුණු ය.

ප්‍රතිදාන උප දර්ශකය තුළ විමසා බැලෙන දැනුම සහ තාක්ෂණික නිමවුම් යටතට ගැනෙන එක කරුණක් වන්නේ දේශීය නිමවුම්කරුවන් ලබා ගන්නා පේටන්ට් බලපත් සංඛ්‍යාව, උපයෝජනය වන භාවිතයන්ගේ නව ආකෘති, නව්‍යකරණයන් පිළිබඳ ව ප්‍රසිද්ධ කරන ලද ලිපි/ පර්යේෂණ පත්‍රිකා ආදිය මගින් දැනුම නිර්මාණය වීම යනාදියයි. ඊට අමතර ව ශ්‍රම ඵලදායිතාව ඉහළ යාම, නව ආයතන බිහිවීම, තත්ත්ව සහතික ලබා ගැනීම්, පරිගණක මෘදුකාංග සඳහා වන වියදම, ඉහළ හෝ ඉහළ මැදි මට්ටමේ උසස් තාක්ෂණික නිමවුම් වශයෙන් වූ සූක්ෂම සහ සාර්ව මට්ටමේ දැකිය හැකි නව්‍යකරණ ප්‍රතිඵල යන කරුණත්, සමස්ත වෙළෙඳාමෙන් බුද්ධිමය දේපළ වශයෙන් සැලකෙන ප්‍රතිශතය, මුළු අපනයනයන්ගේ ප්‍රතිශතයක් ලෙස උසස් තාක්ෂණය සහිත ශුද්ධ අපනයන සහ තොරතුරු තාක්ෂණ අපනයන ප්‍රතිශතය සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය සෘජු ආයෝජන ප්‍රතිශතය යන කරුණත් දැනුම සහ තාක්ෂණික නිමවුම් යටතට ගැනෙන අනෙකුත් කරුණුත් ය.

ප්‍රතිදාන උප දර්ශකයේ අවසාන උප දර්ශකය වන්නේ නිර්මාණාත්මක නිමැවුම් යන්නයි. නවෝත්පාදනයන් සඳහා නිර්මාණාත්මක ව සිතීමේ වැඩ කිරීමේ පරිසරයක් පැවතීම යන කරුණ ඇගැයීම සඳහා කරුණු කිහිපයක් මෙ මගින් ආවරණය කෙරේ. මෙහි දී නව වෙළෙඳ සන්නාම, කාර්මික සැකසුම්, තොරතුරු තාක්ෂණය භාවිත කිරීම්, නවෝත්පාදන හා සම්බන්ධ නව අංශ යනාදිය ඇතුළත් වූ අස්පෘශ්‍ය වත්කම් යන කරුණත්, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රවේශයන් සහිත වූ විනෝදාත්මක සේවාවන් ආදිය ඇතුළත් නිර්මාණාත්මක භාණ්ඩ සහ සේවා නිමැවුම් පැවතීම යන කරුණත් එකිනෙක රටට අදාළ වූ ඉහළ මට්ටමේ ඩොමේන් (domains) සංඛ්‍යාව සහ ඒ හා සම්බන්ධිත ජනගහනයේ වයස් කාණ්ඩ, විකිපීඩියා සංස්කරණ, අන්තර්ජාල වීඩියෝ නිකුත් කිරීම් ආදී අන්තර්ජාලය සම්බන්ධ ක්‍රියාකාරකම් විමසා බැලේ.

### 3. ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම්

නවෝත්පාදන දර්ශකයේ ඉහතින් හඳුන්වා දුන් ඇගැයීම් ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය විමසා බැලීම වැදගත් වේ. ශ්‍රී ලංකාවට අදාළ නවෝත්පාදන දර්ශකය 29.9 වන අතර ඊට අදාළ ව රටවල් 127ක් අතරින් 90 වැනි ස්ථානය ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් ව ඇත. එය පෙර වසරට වඩා එක් අංකයකින් ඉහළ යාමකි. මෙ මගින් ශ්‍රී ලංකාව ලෝකයේ අනෙකුත් රටවල් 37ක් අභිබවා යාමේ ප්‍රමෝදය සමඟ ම තවත් රටවල් 89කට පිටුපසින් සිටීමේ අවදානම සහ අභියෝගය ද පෙන්වා දෙනු ලබයි. ශ්‍රී ලංකාවට අදාළ නවෝත්පාදන නිමැවුම් උප දර්ශකය සහ යෙදවුම් උප දර්ශකය පිළිවෙළින් 23.4ක් සහ 36.3ක් වන අතර අදාළ ශ්‍රේණීන් වන්නේ පිළිවෙළින් 77 සහ 94 වේ. ශ්‍රී ලංකාවට අදාළ කාර්යක්ෂමතා අනුපාතය මගින් දක්වා ඇති, ආදාන උප දර්ශකයට ප්‍රතිදාන උප දර්ශකය දක්වන අනුපාතය 0.6 වන අතර අදාළ ශ්‍රේණිය වන්නේ 58 වේ. මෙ මගින් පෙන්නුම් කෙරෙන්නේ සංසන්දනාත්මක ව බලන විට ජාතික ආර්ථිකයේ නවෝත්පාදනයන් බිහි වීමේ ඇති පරිසරයට සාපේක්ෂ ව නවෝත්පාදනවල ප්‍රතිඵල සියයට 60ක මට්ටමක පවතින බවයි. එ මගින් ආදානයන්ට සාපේක්ෂ ව ප්‍රතිදානයන් සියයට 60ක මට්ටමක පැවතීම තුළ විශිෂ්ට යෙදවුම් නිමැවුම් අනුපාතයක් (එ නම් සියයට 90ක පමණවත්) ලබා ගැනීමේ අභියෝගාත්මක තත්ත්වයක් පිළිබිඹු කෙරේ.

තෝරා ගත් රටවල් කිහිපයක් සමඟ අන්තර්ජාතික ව සංසන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රේණිය පිළිබඳ ව වඩා පුළුල් වැටහීමක් ලබා ගත හැකි වනු ඇත. සංඛ්‍යා සටහන - 3.1 යටතේ දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ක්‍රය ශක්ති සාම්‍යය මත පදනම් වූ ඒක පුද්ගල ආදායම සමඟ සංසන්දනය කළ හැකි මට්ටමේ රටවල් කිහිපයක් සහ විශේෂ දර්ශක අගයන් ලබා ගත් රටවල් කිහිපයකි. කෙසේ වෙතත් ඇතැම් රටවල් සමඟ සංසන්දනය කරන විට අංශ රැසකින් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. එ සේ වුව ද අනෙකුත් බොහෝ රටවල්වලට සේ ම ශ්‍රී ලංකාවට ද ඉදිරියේ දී දුෂ්කර වූ දිගු ගමනක් යාමට සිදු වීමේ අභියෝගයක් ද පවතින බව පෙනේ. ශ්‍රී ලංකාවට වඩා පහළ මට්ටමේ ආදායම් ලබන ඇතැම් රටවල්; උදාහරණ ලෙස වියට්නාමය, කෙන්යාව, ඉන්දියාව, පිලිපීනය, යුක්රේනය, ආර්මේනියාව වැනි රටවල්; ශ්‍රී ලංකාවට වඩා ඉහළ දර්ශක අගයන් ලබා ගනිමින් ශ්‍රේණිගත කිරීමේ ඉහළ මට්ටමක පසු වේ. ආදාන මෙන් ම ප්‍රතිදාන උප දර්ශක අගයන්ගෙන් ද මෙම වෙනස කැපී පෙනෙයි. එ සේ ම විශේෂයෙන් වියට්නාමය, යුක්රේනය, ආර්මේනියාව වැනි රටවල යෙදවුම් නිමැවුම් අනුපාතය සියයට 80ක ඉහළ මට්ටමක පැවැතීම හේතුවෙන් නවෝත්පාදන කාර්යක්ෂමතා අනුපාතය පදනම් වූ ශ්‍රේණිය සංසන්දනාත්මක ව අගය කළ යුතු මට්ටමක පවතී. කෙසෙ වෙතත් චීනය හිමි කර ගෙන විශිෂ්ටත්වය සෑම අංශයකින් ම මෙම ශ්‍රේණිගත කිරීම් තුළ කැපී පෙනේ. අනිත් අතට 2016 වසරේ අදාළ දර්ශක අගයන් සමඟ සසඳා බලන විට කාම්බෝජය සහ මැලේසියාව වැනි රටවල් ශ්‍රේණිගත කිරීමේ පසුපසට ගොස් ඇතත් ශ්‍රී ලංකාව එක පියවරක් ඉදිරියට යාමට සමත් ව ඇත. කෙසේ නමුත් වියට්නාමය මෙම ගමනේ දී පියවර 12ක් ඉදිරියට පැමිණීම කැපී පෙනේ. මෙම සැසඳීමෙන් පිළිබිඹු වන කරුණ වන්නේ ශ්‍රී ලංකාව හමුවේ පවතින අභියෝගාත්මක පරිසරයයි.

මෙම අභියෝගයන් ජය ගැනීමට මෙම දර්ශකයෙන් ආවරණය වන සියලු අංශ කෙරෙහි මනා අවධානයක් යොමු කළ යුතු වේ. මෙහි දී ඇතැම් විශේෂිත අංශ කෙරෙහි විශේෂ අවධානයක් ද යොමු කළ යුතු බව පෙනේ. සංඛ්‍යා සටහන - 3.2හි දක්වා ඇත්තේ විශේෂිත වශයෙන් ශ්‍රේණිගත කිරීම්වල අංකය 100 ඉක්ම වන අවස්ථා කිහිපයකි. උදාහරණ ලෙස අධ්‍යාපන වියදම්, පර්යේෂණ සම්බන්ධ වියදම්, තොරතුරු තාක්ෂණ භාවිතයන්, විදුලි සැපයුම්, විද්‍යා සහ තාක්ෂණ අංශයන්හි පර්යේෂණ ලිපි ආදිය ප්‍රසිද්ධ කිරීම්, ආදී අංශ කිහිපයකින් ම රටවල් 127ක් අතරින් යටත් පිරිසෙයින් රටවල් සියයකට වඩා ශ්‍රී ලංකාව පිටුපසින් සිටින බව පෙනී යයි.

3.1 සංඛ්‍යා සටහන තෝරාගත් රටවල් කිහිපයක දර්ශක අගයන්

| රට | ක්‍රයශක්ති සාම්‍යය පදනම් වූ ඒක පුද්ගල ආදායම (1) | ප්‍රතිදාන උප දර්ශකය පදනම් වූ ශ්‍රේණිය (2) | ආදාන උප දර්ශකය පදනම් වූ ශ්‍රේණිය (3) | ගෝලීය නවෝත්පාදන දර්ශකය පදනම් වූ ශ්‍රේණිය (4) | නවෝත්පාදන කාර්යක්ෂමතා අනුපාතය (5) | නවෝත්පාදන කාර්යක්ෂමතා අනුපාතය පදනම් වූ ශ්‍රේණිය (6) |
|---|---|---|---|---|---|---|
| නේපාලය | 2465.2 | 114 | 108 | 109 (115) | 0.5 | 105 |
| කෙන්යාව | 3207.7 | 70 | 91 | 80 (80) | 0.7 | 50 |
| කාම්බෝජය | 3487.5 | 87 | 104 | 101 (95) | 0.6 | 61 |
| බංග්ලාදේශය | 3606 | 108 | 113 | 114 (117) | 0.5 | 93 |
| පකිස්ථානය | 5000 | 101 | 116 | 113 (119) | 0.6 | 64 |
| වියට්නාමය | 6024.4 | 38 | 71 | 47 (59) | 0.8 | 10 |
| ඉන්දියාව | 6161.6 | 58 | 66 | 60 (66) | 0.7 | 53 |
| පිලිපීනය | 7254.2 | 65 | 83 | 73 (74) | 0.6 | 55 |
| යුක්රේනය | 7518.6 | 40 | 77 | 50 (56) | 0.8 | 11 |
| ආර්මේනියාව | 8457.9 | 47 | 82 | 59 (60) | 0.8 | 17 |
| ශ්‍රී ලංකාව | 10566.2 | 77 | 94 | 90 (91) | 0.6 | 58 |
| ඉන්දුනීසියාව | 11125.9 | 73 | 99 | 87 (88) | 0.7 | 42 |
| මොංගෝලියාව | 12146.6 | 48 | 67 | 52 (55) | 0.7 | 27 |

⋆ 4 වැනි තීරුවේ වරහන් තුළ දක්වා ඇත්තේ පෙර වසරේ හිමි වූ ශ්‍රේණියයි

මූලාශ්‍රයඃ ගෝලීය දරිද්‍රතා දර්ශකය - 2017

3.1 සංඛ්‍යා සටහන තෝරාගත් උපදර්ශකයන් සහ අදාළ ශ්‍රේණිගත කිරීම්

| උප දර්ශකයන් | ලබාගත් ශ්‍රේණිය |
|---|---|
| ආයතන | 111 |
| - නෛතික රාමුව | 125 |
| - රැකියා අහිමිවීම් සඳහා වන්දි ප්‍රදානයන් | 126 |
| මානව සම්පත් සහ පර්යේෂණ | 105 |
| අධ්‍යාපනය | 107 |
| - ද.දේ.නි. අනුපාතයක් ලෙස අධ්‍යාපන වියදම් | 110 |
| - ද.දේ.නි. අනුපාතයක් ලෙස අධ්‍යාපනය සඳහා රජයේ වියදම | 102 |
| - පර්යේෂණ සහ සංවර්ධන වියදම් | 102 |
| යටිතල පහසුකම් | 63 |
| - තොරතුරු තාක්ෂණ භාවිතය | 102 |
| - විදුලිය | 104 |
| වෙළෙඳපොල විචක්ෂණතාව | 86 |
| ණය | 115 |
| දැනුම් සහ තාක්ෂණික නිමැවුම් | 68 |
| - විද්‍යා සහ තාක්ෂණික ලිපි පළකිරීම් | 105 |
| නිර්මාණාත්මක නිමැවුම් | 86 |
| - එකිනෙක රටට අදාළ වූ ඩොමේන් (domains) සංඛ්‍යාව සහ | 102 |

මූලාශ්‍රයඃ ගෝලීය දරිද්‍රතා දර්ශකය - 2017


සියලු රටවල් තරගකාරී ව ඉදිරියට යාමේ දී මනා සැලසුම්කරණයක් සහ ආකල්පමය ශික්ෂණයක් සියලු අංශයන්හි පැවතීම අත්‍යවශ්‍ය වේ. ලෝකයේ බොහෝ රටවල් ඉහත දර්ශකයේ දක්වා ඇති සියලු ම අංශවල ක්‍රියාකාරිත්වය වර්ධනය කර ගනිමින් තරගකාරී ව නවෝත්පාදන කාර්යයේ යෙදේ. ඊට හේතු වන්නේ ඉහළ තාක්ෂණය සහ නවෝත්පාදන මගින් ආර්ථිකයක පෙරළිකාර තත්ත්වයක් බිහි කළ හැකි වීමයි. අනිත් අතට නවෝත්පාදන කාර්යය රටක සියලු ම අංශ සම්බන්ධ වන සංකීර්ණ කාර්යයකි. එ බැවින් සියලු අංශවල මනා ප්‍රගතියක් සහ සම්බන්ධීකරණයක් හරහා නවෝත්පාදන කාර්යයට උචිත පරිසරයක් නිර්මාණය කළ හැකි සේ ම එම නවෝත්පාදන නිමැවුම් හරහා ආර්ථික වර්ධනය වේගවත් කර ගත හැකි වනු ඇත. ඒ තුළින් තරගකාරී පරිසරයක් තුළ ඉහළ දර්ශකාංකයක් සහ ශ්‍රේණිගත කිරීමේ ඉහළ අගයක් වාර්තා කළ හැකි වනු ඇත.■

මූලාශ්‍රː

Global Innovation Index 2017, Innovation Feeding thd World, 10th Edition, Soumitra Dutta, Bruno Lanvin, and Sacha Wunsch-Vincent, Cornell University, INSEAD and the World Intellectual Property Organization (WIPO)

https(//en.wikipedia.org/wiki/Global_Innovation_Index

---




# දැනුම අලුත් කර ගන්න

## මුදලේ ඉතිහාසය

- ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලේ ඉතිහාසය
- විවිධ යුගවල දී භාවිත වූ කාසි හා නෝට්ටු
- ව්‍යවහාර මුදල් මණ්ඩල යුගයේ දී භාවිත කළ නෝට්ටු
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු ම නෝට්ටු කාණ්ඩ
- ශ්‍රී ලංකා සමරු කාසි විකිණීම
- ශ්‍රී ලංකා සමරු කාසි
- මුදල් නෝට්ටු නිෂ්පාදනය
- මුදල් නෝට්ටු වල ආරක්ෂක සලකුණු

## මහ බැංකු ප්‍රකාශන

- උසස් පෙළ, විශ්වවිද්‍යාල සිසුන්ට, විද්‍යාර්ථීන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට
- නවතම දත්ත සහ සංඛ්‍යාන තොරතුරු
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්

## පාසල් ළමුන් සඳහා

- ඉල්ලීම් මත පාසල් ළමුන් සඳහා විශේෂ දේශන
- ආර්ථික හා මූල්‍ය විෂයයන් අලළා ලියවුණු වටිනා පොත් සහ වාර සඟරා රැසක් විකිණීමට

**පාසල් කණ්ඩායම් වශයෙන් පැමිණීම සඳහා විමසන්න.**

**011-2477257**

ෆැක්ස් 011-2346304, ඊ-මේල්; dcommunications@cbsl.lk

**ව්‍යවහාර මුදල් අංශය**

**දුරකථන** : 011-2444503, 011-2477578
**ඊ-මේල්**: currency@cbsl.lk

**ප්‍රකාශන අංශය**

**දුරකථන**: 011-2444502, 011-2477418
**ඊ-මේල්**: dcommunications@cbsl.lk

**සඳුදා සිට සිකුරාදා තෙක්**
**පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා**
(බැංකු නිවාඩු දිනයන්හිදී වසා තැබේ)

**සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල,**
**නො. 54, චැතම් වීදිය, කොළඹ 01**




# ඔබ දන්නවා ද?

**ව්‍යවහාර මුදල් නෝට්ටු නිරූපණය වන පරිදි වෙළඳ දැන්වීම්, ප්‍රචාරණ කටයුතු, පත්‍රිකා, ප්‍රකාශන, භාණ්ඩ ආදී කිසිදු ප්‍රතිනිෂ්පාදන කටයුත්තක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් නොමැතිව සිදු කිරීම නීති විරෝධී බව.**

එ වැනි කටයුත්තක් සඳහා මුදල් නෝට්ටු නිරූපණය කිරීමේ අවශ්‍යතාවක් වේ නම් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් ලබාගන්න.

**විමසීම්**

**ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

දුරකථන : 0112477587 ෆැක්ස් : 0112477726

ඊමේල් : currency@cbsl.lk වෙබ් : www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA